# කොළඹ

## ශාස්ත්‍රීය සංග්‍රහය

2022 (1)

1921 - 2021

University of Colombo

Pioneering Arts and Science in Higher Education




# කොළඹ

## ශාස්ත්‍රීය සංග්‍රහය

2022 (1)

**ප්‍රධාන සංස්කාරක**

සඳගෝමි කෝපරහේවා

**සංස්කාරක මණ්ඩලය**

ලලිතසිරි ගුණරුවන්
නිර්මාල් රංජිත් දේවසිරි
ධම්ම දිසානායක
අනුත්තරාදේවී විද්‍යාලංකාර
සුමිත් චාමින්ද
ඔසඳ ගුණරත්න

**ශාස්ත්‍ර පීඨය**

කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ**
**ශාස්ත්‍රීය සංග්‍රහය - 2022 (1)**

මුද්‍රණය 2022 ජූනි

© **ශාස්ත්‍ර පීඨය** , කොළඹ විශ්වවිද්‍යාලය

**ප්‍රධාන සංස්කාරක**
සඳගෝමි කෝපරහේවා

**සංස්කාරක මණ්ඩලය**
ලලිතසිරි ගුණරුවන්
නිර්මාල් රංජිත් දේවසිරි
ධම්ම දිසානායක
අනුත්තරාදේවී විද්‍යාලංකාර
සුමිත් චාමින්ද
ඔසඳ ගුණරත්න

කංචුක නිර්මාණය - මාලක ලලනජීව

පිටු සැකසුම - තරංගනී ඇලෙක්සැන්ඩර්

ISSN : 2950-6581

මේ ලිපි සංග්‍රහයේ ඇතුළත් ලිපිවල අදහස් එම රචකයන්ගේ විනා සංස්කාරක මණ්ඩලයේ හෝ කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ හෝ අදහස් නොවන බව සැලකුව මනා ය.

**ප්‍රකාශනය**
ශාස්ත්‍ර පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ 3
දුරකථන / ෆැක්ස් 011 2 500442

**මුද්‍රණය**
කොළඹ විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය




# සංස්කාරක සටහන

පළමු වෙළුම/2022 (1)

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන **කොළඹ** - ශාස්ත්‍රීය සංග්‍රහය වූ කලී මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා විෂයක සිංහල භාෂාවෙන් රචිත උසස් ප්‍රමිතියෙන් යුතු ශාස්ත්‍රීය පර්යේෂණ ලිපි පළ වන සම - විමර්ශිත සඟරාවකි. ශාස්ත්‍රාලයීය ප්‍රජාව හා බාහිර විද්වතුන් විසින් ලියන ලද බහුවිෂයික සිංහල ලිපි ප්‍රකාශයට පත් කිරීම සඳහා මේ නව සඟරාව කැප වෙයි.

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා විෂය අරබයා සිංහල මාධ්‍යයෙන් ලියන ලද උසස් ගණයේ ශාස්ත්‍රීය සගරා ගණනාවක් මීට දශක කිහිපයකට පෙර ලාංකේය විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල මූලිකත්වයෙන් බිහි වුවත් වර්තමානයේ එම විෂය ක්ෂේත්‍රයේ දැනුම බෙදා හැරීම සඳහා කැප වුණු සිංහල සඟරා පළ වීමේ සම්ප්‍රදායක් නොමැත. විශ්වවිද්‍යාල අධ්‍යයන අංශ හා ශිෂ්‍ය සංගම් මගින් සිංහල භාෂාවෙන් උසස් මට්ටමක ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශයට පත් කිරීමෙන් විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ට මෙන්ම පොදුවේ සිංහල පාඨක ප්‍රජාවට ද එම ශාස්ත්‍රීය ලේඛන පරිහරණය කිරීමේ අවස්ථාව උදා වේ. උසස් අධ්‍යාපනයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ඉගැන්වීම සම්බන්ධයෙන් සියවසක ඉතිහාසයක් පැවතිය ද වර්තමානයේ සිංහල මාධ්‍යයෙන් එම දැනුම වර්ධනය කිරීම අරබයා සිදු වන කටයුතු ප්‍රමාණවත් නොවේ. ඒ අනුව මානව හා සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ කාලීන පර්යේෂණ සමාජගත කිරීමට හැකි ප්‍රවේශයක් ලෙස සිංහල බසින් ලියැවුණු සම විමර්ශිත ශාස්ත්‍රීය සඟරාවක් එළිදැක්වීමට අවස්ථාව උදාවීම පිළිබඳ ව අප සතුටට පත් වන අතර එහි පළමු කලාපය මෙලෙස ඔබ අතට පත් කරන්නේ මහත් බලාපොරොත්තුවකින් යුක්ත ව ය.

බෞද්ධ අධ්‍යයන, ඉතිහාසය, පුරාවිද්‍යාව, භූගෝල විද්‍යාව, ජන සන්නිවේදනය, සිංහල සාහිත්‍යය යන විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ලියැවී ඇති ශාස්ත්‍රීය ලිපි හතකින් සහ එක් ග්‍රන්ථ විචාරයකින් මෙම මංගල කලාපය සමන්විත ය. සංස්කාරක මණ්ඩලයේ මූලික සමීක්ෂණයකින් පසු ශාස්ත්‍රීය ගුණාත්මක භාවයකින් යුත් ලිපි අදාළ විෂයයෙහි ප්‍රාමාණික සමීක්ෂකවරුන් දෙදෙනකු වෙත යොමු කොට ලබා ගන්නා වාර්තා මත පදනම් වී උසස් මට්ටමක පවතින ලිපි පමණක් **කොළඹ** ශාස්ත්‍රීය සඟරාවේ පළ කිරීම සඳහා තෝරා ගන්නා ලදී. ඉතා ඉහළ ගුණත්වයකින් යුත්

ශාස්ත්‍රීය ලිපි සහිත සඟරාවක් වශයෙන් කොළඹ ශාස්ත්‍රීය සඟරාව ඉදිරියට පවත්වාගෙන යෑම එම සම සමීක්ෂණ ක්‍රියාවලියේ අරමුණ යි. එමෙන්ම ශාස්ත්‍රීය පර්යේෂණවල නියැළෙන විශ්වවිද්‍යාල, උසස් අධ්‍යයන සහ පර්යේෂණ ආයතනවල සේවාස්ථ විද්වතුන්ගේ ලිපි පමණක් මෙම සඟරාවේ පළ කිරීමට සංස්කාරක මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ලැබුවේ ද සඟරාවේ ගුණාත්මකභාවය හා ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීමේ අභිප්‍රායෙනි. උසස් තත්ත්වයේ සිංහල පර්යේෂණ ලිපි කොළඹ ශාස්ත්‍රීය සංග්‍රහය වෙත යොමු කරන ලෙස ඔබට ගෞරවයෙන් ආරාධනා කර සිටිමු.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රය වසර සියයක අභිමානවත් ඉතිහාසයක් සම්පූර්ණ කොට ඇති මෙම අවස්ථාවේ දී පළමු වරට සිංහල බසින් සම විමර්ශිත ශාස්ත්‍රීය සඟරාවක් කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය මගින් ප්‍රකාශයට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙබඳු ශාස්ත්‍රීය සඟරාවක වැදගත්කම පෙන්වා දුන් අවස්ථාවේ දී ඊට අනුග්‍රහය දැක්වූ හිටපු ශාස්ත්‍ර පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා මහතාට ද මේ කර්තව්‍යය සිදු කර ගෙන යෑම සඳහා අප දිරිමත් කරන වර්තමාන ශාස්ත්‍ර පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලසන්ත මානවඩු මහතාට ද සඟරාවේ සංස්කරණ ක්‍රියාවලිය සඳහා තම කාලය කැප කළ සංස්කාරක මණ්ඩලයට ද අපගේ ප්‍රණාමය හිමි විය යුතු ය.

**සඳගෝමි කෝපරහේවා**
ප්‍රධාන සංස්කාරක
2022 ජූනි

# පටුන


1. භාරතීය ස්වප්න විද්‍යාවෙහි පැනෙන ස්වප්න මූලාශ්‍රය පිළිබඳ අධ්‍යයනයක් 18-32
**පූජ්‍ය කඩවලවැවේ කල්‍යාණ හිමි**

2. ශ්‍රී ලංකාවේ අප්‍රිකානු ජනයාගේ (සිලෝන් කැෆර්වරුන්ගේ) සමාජ සම්බන්ධතාවල ස්වරූපය පිළිබඳව සමාජ ජාල විශ්ලේෂණයක් 33-60
**ඩබ්ලිව්. යූ. ටී. ප්‍රසාද්**
**ආනන්ද වයි. කරුණාරත්න**

3. සිංහල කාන්තා පුවත්පත්වල ප්‍රකාශිත ස්ත්‍රීත්වය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් 61-80
**ලතා ගුරුසිංහ**

4. පුරාතන ශ්‍රී ලංකාවේ ජල හා භූමි කළමනාකරණය (භූගෝල විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විමසා බැලීම) 81-111
**වී.පී.අයි.එස් විජේරත්න**

5 සම්භාව්‍ය සිංහල සන්දේශ සාහිත්‍යයෙහි ලිංගිකත්ව සන්නිවේදනය 112-131
**කල්‍යාණි විජේසුන්දර**

6. ථෙරවාද බුදුසමයෙහි දැක්වෙන ප්‍රතිසන්ධිය පිළිබඳ අධ්‍යයනයක් 132-147
**පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි**

7. ඉතිහාසය, ඉතිහාසකරණය හා එම විෂයයන්හි ස්වභාවය 148-177
**මහින්ද සෝමතිලක**

8. ග්‍රන්ථ විචාර
ගණනාථ ඔබේසේකරගේ *The Many Faces of the Kandyan Kingdom: 1591-1765 Lessons for our time* 178-185
**නිර්මාල් රංජිත් දේවසිරි**

## ලිපි සම්පාදකයෝ

**පූජ්‍ය කඩවලවැවේ කල්‍යාණ හිමි**
බී.ඒ. (ගෞරව), එම්. ඒ. (කැලණිය), රාජකීය පණ්ඩිත,
සහකාර කථිකාචාර්ය, දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**ඩබ්ලිව්. යූ. ටී. ප්‍රසාද්**
බී. ඒ. (ගෞරව) කොළඹ

**ආනන්ද වයි. කරුණාරත්න**
බී.ඒ. (ගෞරව) කොළඹ, එම්.ඒ. (කොළඹ), විද්‍යාපති (පේරාදෙණිය), පීඑච්.ඩී (සියෝල් ජාතික විශ්වවිද්‍යාලය)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

**ලතා ගුරුසිංහ**
බී.ඒ. (ගෞරව) (කොළඹ), එම්.ඒ. (කොළඹ), එම්.ඒ. (කැලණිය), පීඑච්.ඩී (කොළඹ),
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අංශය, කොළඹ විශ්වවිද්‍යාලය

**වී.පී.අයි.එස්.විජේරත්න**
බී.ඒ. (ගෞරව) කොළඹ, විද්‍යාපති (පේරාදෙණිය)
කථිකාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

**ඩබ්. එම්. කල්‍යාණි විජේසුන්දර**
බී.ඒ. (ගෞරව) (කොළඹ) එම්. ඒ. (කැලණිය)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

**පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි**
බී.ඒ. (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර, එම්.ඒ. (කැලණිය), එම්.ෆිල්. (ශ්‍රී ජයවර්ධනපුර), පීඑච්.ඩී. (කැලණිය)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බෞද්ධ අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය

**මහින්ද සෝමතිලක**
බී.ඒ. (ගෞරව), එම්.ඒ. (පේරාදෙණිය) පීඑච්.ඩී. (ජේ එන් යූ)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**නිර්මාල් රංජිත් දේවසිරි**
බී.ඒ. (ගෞරව) කොළඹ, එම්. ෆිල් (කොළඹ), පීඑච්.ඩී. (ලයිඩන්)
මහාචාර්ය, ඉතිහාස අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ අප්‍රිකානු ජනයාගේ (සිලෝන් කැෆර්වරුන්ගේ) සමාජ සම්බන්ධතාවල ස්වරූපය පිළිබඳව සමාජ ජාල (Social Networks) විශ්ලේෂණය

ඩබ්.යූ.ටී. ප්‍රසාද්, ආනන්ද වයි. කරුණාරත්න


## සාර සංක්ෂේපය

සිය ප්‍රජාව සමඟ දැඩි අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පවතින ශ්‍රී ලංකාවේ අප්‍රිකානු ජනයා හෙවත් සිලෝන් කැෆර්වරුන් අද වනවිට ශ්‍රී ලංකාව තුළ සමාජානුයෝජනය වෙමින් පවතින බව හඳුනාගත හැකි ය. තමන්ගේ සංස්කෘතියට වඩා සම්පූර්ණයෙන් ම වෙනස් සංස්කෘතියක් තුළ දීර්ඝ කාලයක් තිස්සේ මුසුවීම හේතුවෙන් ම ඔවුන් සමාජය තුළ සම්බන්ධතාව පවත්වාගන්නා වූ ආකාරය කෙසේ ද? යන්න විමර්ශනය කළ යුතු ප්‍රස්තුතයක් මෙන් ම ප්‍රහේලිකාවක් ද වන්නේ ය. මෙම සමාජානුයෝජනය සමාජ ජාල විශ්ලේෂණය ඇසුරින් හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ යි. මෙතෙක් පළ කොට ඇති සාහිත්‍ය සන්දර්භයට අනුව ශ්‍රී ලාංකික ජන සමාජය සමඟ සබඳතා පවත්වන, ශ්‍රී ලංකාවේ ජීවත්වන ප්‍රාථමික ජන කණ්ඩායමක සමාජීය හැසිරීම අධ්‍යයනයට සමාජ ජාල විශ්ලේෂණය (Social Network Analysis/ SNA) යොදාගත් පළමු අවස්ථාව වන්නේ ද මෙයයි. මෙහි දී විශේෂයෙන් ම ශ්‍රී ලාංකික අනෙකුත් ජන කණ්ඩායම් සහ සේවා නිලධාරීන් සමඟ කැෆර් ජනයාගේ සමාජ සබඳතා හඳුනාගැනීමට සමාජජාල විශ්ලේෂණය යොදාගෙන ඇත. සිලෝන් කැෆර් ප්‍රජාව ජනාවාසගත වී ඇති පුත්තලම සිරම්බිඅඩිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය මෙහි අධ්‍යයන ප්‍රදේශය වේ. මෙම ග්‍රාම නිලධාරී වසමේ සිටින සියලු කැෆර් පවුල් අධ්‍යයනය සඳහා යොදාගෙන ඇත. සමාජජාල විශ්ලේෂණය සඳහා අවශ්‍ය දත්ත සිලොන් කැෆර් කුටුම්භ සඳහා යොමුකරන ලද ප්‍රශ්නාවලියක් හා සම්මුඛ සාකච්ඡා ඇසුරින් ලබාගෙන ඇත. ප්‍රතිඵල විශ්ලේෂණයට අනුව සිලෝන් කැෆර් ප්‍රජාව සමඟ සිංහල ජාතීන් වැඩි සබඳතා පවත්වන බවත්, ඔවුන් බොහෝමයක් අසල්වාසීන් හා කතෝලික දේවස්ථානය හා සම්බන්ධ පුද්ගලයන් බවත් අනාවරණය විය. එමෙන් ම සේවා නිලධාරීන් ලෙස ග්‍රාම නිලධාරී හා පල්ලියේ පියතුමා සමඟ වැඩි සබඳතා ඇති බවත්, ආනුභවික ප්‍රතිඵල ඇසුරින් හඳුනාගත් ප්‍රධාන තත්ත්වයන් ය. ඒ අනුව මෙම අධ්‍යයනය සමාජ ජාල ඥාන විමංසා සාහිත්‍ය (literature of social networks epistemology) සන්දර්භයට නව දායකත්වයක් එක්කරනු ඇත.


**මුඛ්‍ය පද : ශ්‍රී ලංකාවේ අප්‍රිකානු ජනයා, සිරම්බිඅඩිය, සමාජ ජාල විශ්ලේෂණය, සිලෝන් කැෆර්, සමාජ ජාල ප්‍රස්තාර.**

## හැඳින්වීම

අප්‍රිකානු සම්භවයක් සහිත ශ්‍රී ලාංකික සමාජ සන්දර්භයට අනුගත වූ සුවිශේෂී ජන කොට්ඨාසයක් ශ්‍රී ලාංකික ජනවර්ග අතර දක්නට ලැබේ (ජයමාන්න, 2017:12 ; දිසානායක, 1996:8: Arachchige, 2017; Jayasuriya, 2006). ඔවුහු ශ්‍රී ලංකාවේ ජන සමාජය තුළ කැෆ්ර්වරු ලෙස හඳුන්වති. යටත් විජිත කාලයේ දී මෙරටට වහලුන් ලෙස පැමිණි සංක්‍රමණික කණ්ඩායමක් ලෙස සිලෝන් කැෆ්ර්වරුන් දැක්විය හැකි ය (ගන්කන්ද, 2007:21-23; Walker, 1949; ). මොවුන් ක්‍රි.ව. 1630 දී පමණ ශ්‍රී ලංකාවට පැමිණ ඇතැයි සඳහන් වේ (ගන්කන්ද, 2007:22; එදිරිසිංහ, 2000:27; Dissanayaake and Premarathne, 2016).

ජනවර්ග වර්ගීකරණයට අනුව නීග්‍රෝ වර්ගයට අයත් මොවුහු ශ්‍රී ලාංකික අනෙකුත් ජන සමාජ අතුරින් සුවිශේෂී වන්නේ ඔවුන්ගේ දේහ ලක්ෂණ, සංස්කෘතික ආචාර ධර්ම, භාෂාව ආදී ඔවුන්ට ම අනන්‍ය වූ විවිධ සුවිශේෂතා පවතින බැවිනි (කුමාර,2016:61; දිසානායක,2014:42). පෘතුගීසි යුගයේ දී මුල්වරට මෙරටට සංක්‍රමණය වීමත්, වර්තමාන ජනාවාසගත වීමත්, සමාජ අනුගත වීමත් යන දීර්ඝකාලීන ක්‍රියාවලිය තුළ ඔවුන් කාලීන ව මෙන් ම අවකාශීය වශයෙන් ද විතැන්වීමක් හඳුනාගත හැකි ය. මෙය ඔවුන් පිළිබඳ සඳහන් අතීත වාර්තා හා වර්තමාන තත්ත්වය පිරික්සා බැලීමේ දී පැහැදිලිවන කරුණකි (පොන්නම්පෙරුම, 1967:34; රත්නායක, 2007:73; පියසේන, 1966:50; Brown, 1999). අතීත ගෝත්‍රික කැෆ්ර් ප්‍රජාවට සාපේක්ෂ ව වර්තමාන කැෆ්ර් ජනයා විශාල සමාජයීය, ආර්ථික මෙන් ම සංස්කෘතික පරිවර්තනයකට ලක් ව ඇති අතර ඒ සඳහා වැඩි බලපෑමක් සමාජානුයෝජනය තුළ සිංහල ජාතියෙන් හා කතෝලික ආගමෙන් එල්ල වී ඇත. එම තත්ත්වයන් සමාජ ජාල පර්යේෂකයන් මනාව හඳුනාගෙන ඇත (Barnes-Mauthe *et al.*, 2013; Bellotti, 2008).

මිනිසා යනු තම පැවැත්ම වෙනුවෙන් විශාල කණ්ඩායමක් ලෙස එකට එකතු වී ජීවත්වන සත්ත්වයෙකි. එනම් මිනිසාගේ පැවැත්ම තහවුරු කරන ප්‍රධාන සාධකය සහ ඔහු අනෙකුත් සත්ත්ව කොට්ඨාස අතරින් විශේෂ කොට වෙන් කළ හැක්කේ මෙම සමාජ සම්බන්ධතා යන සාධකය මුල්කර ගනිමිනි (Harari, 2015). එනිසා ම ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන ජන කණ්ඩායම් කිහිපයක් සමඟ ගැටෙමින් තම ජාතියට අනන්‍ය වූ සංස්කෘතික හැඩතලයන් රැකගැනීම සුළු ජන කණ්ඩායමක් ලෙස කැෆ්ර්වරුන් ට ඉතාමත් ප්‍රබල අභියෝගයක් වන්නේය. එම අභියෝගයට ඔවුන් කෙතරම් සාර්ථක ව මුහුණ දෙනවා ද යන්න පිළිබඳ ව හඳුනාගැනීමට නම් සමාජය සමඟ ඔවුන් ගැටෙන ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත් වේ.

ලෝකය තුළ මිනිසා විවිධාකාරයෙන් විවිධ සමාජ-සංස්කෘතීන් හා සම්බන්ධ වී නව සමාජ සම්බන්ධතා හරහා වෙනස් ස්වරූපයන් හි සංස්කෘතීන් බිහිකර ගන්නා අවස්ථාවන් නැතුවම නොවේ (Wittek, Kroneberg, and Lämmermann, 2020; Stadtfelda, Takács, and Vörös, 2020; Bellotti, 2008; නෙස්තුර්ග්, 1981:21). සංස්කෘතිය (culture) යන්න පරිණාමය තුළ බොහෝ වෙනස්කම් දක්වයි (Hornby, 2015). ඒ අනුව කැෆ්ර් ජනයා ද මෙසේ සමාජ සම්බන්ධතා පවත්වාගෙන යනු ලබන

ආකාරය කෙරෙහි සහ ඒ සම්බන්ධතාවන්හි ස්වරූපයන් පිළිබඳව ද අවධානය යොමු කිරීමට මෙම පර්යේෂණය තුළ දී උත්සාහ ගෙන ඇත.

සංක්‍රමණික කණ්ඩායමක් ලෙස ශ්‍රී ලංකාවට පැමිණ ස්ථිර පදිංචිකරුවන් බවට පත් ව ඇති සුවිශේෂී ජන කණ්ඩායමක් ලෙස සිලෝන් කැෆ්රවරුන් හඳුනාගත හැකි ය (අබයසිංහ, 1969:102-105; ඇල්ලේපොළ, 2008:84). තමන්ගේ සංස්කෘතියට වඩා සම්පූර්ණයෙන් ම වෙනස් සංස්කෘතියක් තුළ දීර්ඝ කාලයක් තිස්සේ මුසුවීම හේතුවෙන් ම ඔවුන් සමාජය තුළ සම්බන්ධතා පවත්වාගන්නා වූ ආකාරය කෙසේ ද? යන්න සලකා බැලිය යුතු හා විමර්ශනය කළ යුතු ප්‍රස්තුතයක් මෙන් ම ප්‍රහේලිකාවක් ද වන්නේ ය. ශ්‍රී ලංකාව තුළ ප්‍රාථමික ජන කණ්ඩායමක් ලෙස හඳුනාගත හැකි ඔවුන්ට සුවිශේෂී නර්තන, ගායන, වාදන හැකියාවන් ඇති අතර (ආරියරත්න, 1985:29; අල්විස්,2004:110-113), ඉතා විනෝදකාමී ජන කණ්ඩායමක් වන කැෆ්රවරුන්ගේ එම සුවිශේෂිතා මෙන් ම ඔවුන් සමාජය තුළ හැසිරෙන ආකාරය ද, සමාජය තුළ සම්බන්ධතා ගොඩනඟා ගනිමින් සිය ජීවිකාව ගෙනයන අයුරු ද කුතුහලය දනවන සුලු වේ (Jayasuriya, 2019). මානව වර්ගයන්ට සුවිශේෂී වූ ගතිලක්ෂණ විමර්ශනය ඔවුන්ගේ පරිණාමික අගයයන් හා ගති-ලක්ෂණ (evolutionary values and characteristics) අධ්‍යයනයේදී ඉතා වැදගත් ය (දිසානායක, 2004:85; පියසේන, 1966:67). භාෂාව ද ඒ අතර ප්‍රමුඛ යැයි සැලකිය හැකි තරම් ඉතා වැදගත් ය (දිසානායක, 2014:81). මේ නිසා ම මෙම අධ්‍යයනය පර්යේෂණ ක්ෂේත්‍රය තුළ වැදගත් පර්යේෂණයක් වනු ඇත. වර්තමානය වන විට සිරම්බිඅඩිය ග්‍රාමය තුළ පවුල් විසිතුනක් (23) ජීවත් වන අතර එම පවුල් විසිතුන තුළ පුද්ගලයින් හැටදෙදෙනකු (62) සිටී. මෙම පුද්ගලයන් හැටදෙදෙනා අතුරින් තිස්හත්දෙනෙකු (37) ස්ත්‍රීන් වන අතර පුරුෂයන් විසිපස්දෙනෙකු (25) වේ. ඒ අනුව වැඩි ප්‍රතිශතයක් එනම් 59.68%ක ප්‍රතිශතයක් ස්ත්‍රීන් වන බව හඳුනාගත හැකි ය. පුත්තලම ප්‍රදේශයේ ජනාවාසගත වූ ජනයා මුල්කාලීන ව පුත්තලම ලුණු ලේවායේ වැඩට සම්බන්ධ වී ඇති අතර බ්‍රිතාන්‍ය පාලන කාලයේ දී ඔවුන් යටතේ ජල පහසුකම් ලබාගෙන ප්‍රදේශයට ආවේණික ගොවිතැනෙහි නිරත වී ඇත (රත්නායක, 2007:114). නමුත් අද වනවිට ඔවුන් ජලය ලබා ගැනීමේ අපහසුතා හා අපේක්ෂිත අස්වැන්නක් ලබා ගැනීමට නොහැකිවීමත්, කෘෂි යෙදවුම් සඳහා අධික මිලක් වැයවීමත් නිසා සම්පූර්ණයෙන් ම පාහේ කෘෂිකාර්මික කටයුතුවලින් ඈත් ව කටයුතු කරන අතර විවිධ රැකියාවල නිරත ව සිටී.

තව ද ශ්‍රී ලංකාවේ කැෆ්ර ජනතාව පිළිබඳ ව විවිධාකාරයේ සමාජ විද්‍යාත්මක පර්යේෂණ සඳහා යොමු වී තිබුණ ද ප්‍රාථමික ජන කණ්ඩායමක් ලෙස ඔවුන් සමාජය තුළ අනෙකුත් සමාජ කණ්ඩායම් සමඟ ගැටෙන ආකාරය කෙරෙහි කිසිඳු පර්යේෂණයකින් අවධානය යොමුකොට නොමැත (ඉන්ද්‍රජිත්,2007:113-114; හෙට්ටිආරච්චි, 1963:151). ඒ අනුව ශ්‍රී ලාංකික ජන සමාජය සමඟ සබඳතා පවත්වන, ශ්‍රී ලංකාවේ ජීවත්වන ප්‍රාථමික ජන කණ්ඩායමක සමාජීය හැසිරීම අධ්‍යයනයට සමාජ ජාල විශ්ලේෂණය (Social Network Analysis) යොදාගත් පළමු අවස්ථාව මෙය බව පෙන්වාදිය හැකි ය. එමගින් සමාජ සම්බන්ධතා මොනවට නිරූපණය කළ හැකි බැවිනි (Knoke, 2008; Serrat, 2017). එ බැවින් මෙවැනි ම සමාජය තුළ වැඩි

කතාබහකට ලක් නොවන නමුත් ලාංකික ජන සමාජයට ම අයත් සුළු ජන කණ්ඩායම් කෙරෙහි සමාජ අවධානය යොමු කිරීමටත්, තවදුරටත් අවධානය යොමු නො වූ මෙවැනි ජන කණ්ඩායම් කෙරෙහි පිරික්සුම් ඇස යොමු කිරීමටත් පාසල් සිසුන්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් හා ගවේෂකයින්ට මෙම අධ්‍යයනය මනා පිටිවහලක් වනු ඇත. මේ අයුරින් ඉහත දැක්වෙන පරිදි විවිධ අංශයන් ඔස්සේ මෙම අධ්‍යයනයේ වැදගත්කම සාධාරණීකරණය කළ හැකි  අතර මෙමඟින් ශ්‍රී ලංකාවේ අප්‍රිකානු ජනයාගේ (සිලෝන් කැෆර්වරු) සමාජ සම්බන්ධතාවල ස්වරූපය කෙබඳු ද? යන පර්යේෂණ ගැටලුව පිළිබඳ ව අධ්‍යයනය කෙරේ.

**කාපිරි ජනයා**

මිනිසා හුදු ජීව විද්‍යාත්මක සත්වයෙකි. මානව පරිණාමය තුළ මෙම ජීව විද්‍යාත්මක විකාශනය පිළිබඳ ව මනාව කරුණු දක්වා ඇත. වෙන් වෙන් ව හඳුනාගත හැකි පරම්පරානුගත ලක්ෂණ විද්‍යාමාන වන මනුෂ්‍ය කොට්ඨාසයක් මානව වර්ගයක් ලෙස දැක්විය හැකි ය (පියසේන, 1966:91-95). මුළු මිනිස් සංහතිය ම මානව විද්‍යාඥයන් විසින් විශේෂ අධ්‍යයනයට භාජනය කරන ලද අතර විද්‍යාඥයන්ගේ බහුතර මතය අනුව වර්ග තුනකට බෙදා දක්වන ලදී (නෙස්තුර්හ්, 1981).

නීග්‍රොයිඩ් (Negroid)
කෝකසොයිඩ් (Caucasuid)
මොන්ගොලයිඩ් (Mongoloid)

මානව වර්ගීකරණය අනුව නීග්‍රොයිඩ් වර්ගයත් අප්‍රිකානු මානව වර්ගීකරණය අනුව නීග්‍රෝ වර්ගයටත් කාපිරි ජනයා අයත් වෙති. නීග්‍රොයිඩ් වර්ගයේ ලක්ෂණ වනුයේ රැළි ගැසුණු හිසකෙස්, කළු පැහැති වූ ඉතා කළු පැහැති සම, ඉදිරියට නෙරා ඇති ඇස්, පැතලි නාසය, පුළුල් වූ නාස්පුඩු බහුතරයකගේ ඇත්තේ සනැති තොල් ය. දිගැටි හිස, නිකට මද වශයෙන් වැඩී ඇත. උඩු හනුව සහ යටි හනුව නෙරා ඇත (දිසානායක, 2004: 69-71).

කාපිරි යන වචනයට ද විවිධ අර්ථකථන සාහිත්‍ය පිරික්සීමේ දී හඳුනාගැනීමට හැකි වේ. *Encyclopadia Britannica* (1989) දක්වන ආකාරයට කාපිරි යන්න Kaffir, Kafir ලෙස හෝ KAFIR ලෙස ලියා දැක්විය හැකි අතර, කාපිරි යන්නෙන් අර්ථ නිරූපණය කරන්නේ (අරාබි) ඇදහීමක් නැති මිථ්‍යා දෘෂ්ටික ගණයට අයත් දකුණු අප්‍රිකානු බන්ටු භාෂා කතා කරන මිනිසුන් වර්ගයක් ලෙස ය. දකුණු අප්‍රිකාවේ දී ඕනෑ ම කළු අප්‍රිකානුවෙකු හැඳින්වීම සඳහා මෙය සාමාන්‍යයෙන් අවමානාත්මක ආකාරයට යොදයි (රස්නායක, 2007:27).

කාපිරි ජනයා මෙරටට පැමිණියේ අධිරාජ්‍යවාදීන්ගේ වහලුන් හැටියට ය (සෝමසුන්දර, 2007:71). ආදි යටත්විජිත යුගයේ ආරම්භක සමය සලකුණු කළ ගැටුම් අතරතුර විවිධ ජාතීහු අප්‍රිකාවේ නැගෙනහිර වෙරළේ පිහිටි මොසැම්බිකය ආශ්‍රිත ප්‍රදේශයේ ජීවත් වූ කාපිරි මිනිසුන් මිලට ගත්හ. එය එක් මිනිස් කොටසක් විසින් තවත් මිනිස් කොටසක් හුදු වෙළඳ භාණ්ඩ වශයෙන් සලකනු ලැබීමේ යුගයක්

විය. මේ කාපිරි ජනයා සොල්දාදුවන් වශයෙන් ද, කඳවුරු සහයකයන් වශයෙන් ද උපයෝගී කර ගැනුණහ. කාපිරින් මොසැම්බික් රටට අමතර ව උගන්ඩා සහ මැඩගස්කාර් රටවලින් ද පැමිණි බව කියැවේ (එදිරිසිංහ, 2000: 119-121).

පෘතුගීසි යුගයේ දී මෙරට කාපිරි ජනයා 300ක් පමණ විය (පොන්නම්පෙරුම, 1967:29). පෘතුගීසි යුගයේ දී හමුදා සේවයට අමතර ව වහල් සේවයටත් ලස්කිරිඤ්ඤ හමුදා සේවය, හමුදා සංගීත ඒකකවල වාදනය, පරංගි ප්‍රභූ නිවෙස්වල මෙහෙකාරකම, මසුන් ඇල්ලීම, ගෘහ සේවය (කාපිරි ස්ත්‍රීන්), බලකොටුවල සේවය සහ වෙනත් කුලී වැඩ සඳහා ද කාපිරි ජනයා යොදවන ලදි (රස්නායක, 2007:36). පී.එස්. පීරිස් විසින් රචිත *Ceylon and the Protaguse* ග්‍රන්ථයේ සඳහන් පරිදි පෘතුගීසීන්ගෙන් ලන්දේසීන් ලංකාව 1976 දී අල්ලා ගනු ලැබූ අතර එහි දී පෘතුගීසීන් යටතේ සිටි කාපිරි සහ කැනරීස්වරුන් ලන්දේසීන් යටතට පත්කරන ලදී (රස්නායක, 2007:39). එම යුගයේ දී 4000ක් පමණ කාපිරි ජාතිකයන් ශ්‍රී ලංකාවේ වාසය කර තිබේ (ගන්කන්ද, 2007:116). පෘතුගීසි හා ලන්දේසි යුගයන්හි දී මෙන් ම ඉන්පසු ශ්‍රී ලංකාවේ යටත් විජිතයක් ලෙස පාලනය කළ ඉංග්‍රීසීන් ද සම්බන්ධ ව කාපිරි ජනයා පිළිබඳ ව ඇත්තේ එවැනි ම තොරතුරු විය. කාපිරි ජනයා ලස්කිරිඤ්ඤ භටයන් ලෙස සේවය, හමුදා තූර්යවාදන සේවය, ඉංග්‍රීසීන් තැනින් තැන ඉදිකළ යුද බලකොටු රැකවල් කිරීම ආදිය මෙන් ම කොළඹ - නුවර පාර කැපීමේ කම්කරුවන් ලෙස ද කටයුතු කළහ (අල්විස්, 2004:14). 1807 දී ඉංග්‍රීසි හමුදාවේ කාපිරි සේනාංකයේ 700ක පිරිසක් සිටි බව කියවේ (එදිරිසිංහ, 2000:152).

පෘතුගීසි බසින් කාපිරි යන්න හැඳින්වීමට Cafre යනුවෙන් භාවිතා කරයි. ලන්දේසි බසින් එය Kaffer ය. ඉංග්‍රීසි බසින් මෙය Kaffir වීම නිසා මෙරට ස්ථිර පදිංචිකරුවන් වූ කාපිරි ජනතාවට සිලෝන් කැෆර් යන නම ලැබී ඇත (ආරියරත්න, 1985:141). වර්ෂ 1845 දී බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවේ වහල් සේවය තහනම් කළහ (ගන්කන්ද, 2007:112). මේ නිසා මෙරට සිටි කාපිරි ජනයා ආපසු තම මව් රටවල් බලා ගිය අතර එහි දී ඉතුරු වූ කාපිරි ජනයා ඉංග්‍රීසි ආරක්ෂක බලකොටු අවට පදිංචි විය. ඔවුන් පුත්තලම, මඩකලපුව, කොළඹ, ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල නැවතුණු අතර මුහුදුබඩ පළාත්වල පදිංචි වූ පිරිස ධීවර කර්මාන්තයට නැඹුරු වූ බව පෙනී යයි (රස්නායක, 2007:112-113).

**සමාජ ජාල පිළිබඳ හැඳින්වීමක්**

ලෝකය තුළ මානව වර්ගයා පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී වැදගත් අංශයක් ලෙස ඔවුන්ගේ සමාජ සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනය පෙන්වාදිය හැකි ය. මිනිසුන් ලෙස ඔවුන් ජීවත්වන සමාජය තුළ මෙන් ම බාහිර සමාජය සමඟ ද ඔවුන් නිතර අන්තර් සම්බන්ධතා පවත්වයි. මෙම සබඳතා අධ්‍යයනයට යොදාගත හැකි හොඳ ම ක්‍රමවේදය වනුයේ සමාජ ජාල විශ්ලේෂණයයි. එනම්, මානව සමාජය තුළ 'රටාගත සම්බන්ධතා' ග්‍රහණය කරගැනීමේ මෙවලම වන්නේ සමාජ ජාල විශ්ලේෂණයයි (Social Network Analysis) (Knoke & Yang, 2008).

සමාජ ජාලයක මූලික අදහස ඉතා සරල ය. සමාජ ජාලයක් යනු, එකිනෙකා සමඟ සබඳතා (දාර හෝ බැඳීම්) ඇති සාමාජිකයින් (පුද්ගලයන්) සමූහයකි. ජාලවලට සාමාජිකයින් කිහිප දෙනකු හෝ වැඩි ගණනක් සිටිය හැකි අතර ඔවුන් යුගල අතර සබඳතා එකක් හෝ කිහිපයක් තිබිය හැකි ය (Hanneman & Riddle, 2005:84).

සමාජ ජාලයක ඉතා වැදගත් සංකල්ප දෙකක් හඳුනාගත හැකි ය.

- සාමාජිකයින් (පුද්ගලයන්/Nodes/Actors)
- දාර (සබඳතා /Ties)

සමාජ ජාලයක් ගොඩනැගීමේ දී මෙම සංකල්ප ද්විත්වය ඉතා වැදගත් වේ. මෙහි දී සාමාජිකයින් (Nodes) යනු සමාජ ජාලය තුළ යටත් පුද්ගලයන් ය. ඔවුන් ක්‍රියා කරන නැතහොත් පවත්වන සබඳතා දාර (Ties) මගින් පෙන්නුම් කරයි (Hanneman & Riddle, 2005:51). ජාල විශ්ලේෂණයේ දී අවධානය යොමු කරන්නේ සාමාජිකයින් අතර සබඳතා පිළිබඳ ව මිස තනි පුද්ගලයන් හෝ ඔවුන්ගේ ගුණාංග පිළිබඳ ව නොවේ. එබැවින් සාමාජිකයන් හා දාර යන අංශ දෙක ම සමාජ ජාල අධ්‍යයනයේ දී ඉතා වැදගත් සංකල්ප දෙකකි.


ශ්‍රී ලංකාවේ අප්‍රිකානු ජනයා අනෙකුත් ජනවර්ගයන් හා පවත්වන අන්තර් සම්බන්ධතාවයන් හි ස්වරූපයන් කුමන ආකාර ද? සහ ඔවුන් ප්‍රදේශයේ සේවා නිලධාරීන් සමඟ පවත්වන සම්බන්ධතාවයන් කෙබඳු ද? යන පර්යේෂණ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම මෙම අධ්‍යයනය මගින් සිදුකර ඇත. ඒ අනුව අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ අප්‍රිකානු ජනයාගේ (සිලෝන් කැෆ්‍ර්වරුන්ගේ) සමාජ සම්බන්ධතාවල ස්වරූපය පිළිබඳ ව අධ්‍යයනය කිරීමයි.

## අධ්‍යයන ප්‍රදේශය

**නිරපේක්ෂ පිහිටීම** : සිරම්බිඅඩිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය වසම උතුරු අක්ෂාංශ අංශක 8° 0' - 8° 5' (8° 0' 5.97N - 8° 5' 43.79N) හා නැගෙනහිර දේශාංශ 79° 51' - 79° 53' (79° 51' 49.57E – 79° 53' 1.69E) අතර පිහිටා ඇත. වර්ග කිලෝමීටර් 19.7ක භූමි ප්‍රදේශයක් මෙම ග්‍රාම නිලධාරී වසමට අයත් වේ.

**සාපේක්ෂ පිහිටීම** : ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්වන ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් ලෙස 615/D සිරම්බිඅඩිය ග්‍රාම නිලධාරී වසම පෙන්වාදිය හැකි ය. පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 6කට හා වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 2කට මායිම් ව සිරම්බිඅඩිය ග්‍රාම නිලධාරී වසම පිහිටා ඇත (සිතියම් අංක 1).

ඒවා නම්, උතුරින් - මයිලන්කුලම ද, වයඹ දිගින් - වට්ටකන්ඩල් යන වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් ද, වයඹ දිගින් - මනල්තිව් ද, බටහිරින් - පුත්තලම නැගෙනහිර සහ සෙනකුඩිරිප්පුව ද, දකුණින් - තම්මැන්නාගම ද, නැගෙනහිරින් - සෙල්ලකන්ඩල් සහ නෙළුම්වැව යන පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් ද පෙන්වාදිය හැකි ය.




**සිතියම් අංක 1 :** අධ්‍යයන ප්‍රදේශයේ සිතියම

**මූලාශ්‍රයඃ** සමීක්ෂකයන් විසින් සකස් කරන ලදී, 2020.

අධ්‍යයනය සිදු කිරීමේ දී අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඊට අදාළ ව ප්‍රාථමික හා ද්විතීයික යන දත්ත මූලාශ්‍ර ආකාර ද්විත්වය ම යොදා ගෙන ඇත. පුත්තලම කැෆ්ර් ප්‍රජාව වැඩි වශයෙන් වාසය කරන සිරම්බිඅඩිය ග්‍රාම නිලධාරී වසම තුළ ජීවත්වන පවුල් සියල්ල ම සඳහා ප්‍රශ්නාවලිය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය සිදු කරන ලදී. එනම් සංගහනය ම නියදිය ලෙස සලකන ලදී. මෙහි දී පවුල් 23ක් දත්ත එක්රැස් කිරීම සඳහා තෝරාගන්නා ලදී. පර්යේෂණයේ දත්ත එක්රැස් කිරීමේ කාලසීමාවේ දී රට තුළ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් එම නිවෙස්වලට ගොස් ප්‍රශ්නාවලිය සඳහා හා සම්මුඛ සාකච්ඡා පිළිතුරු ලබාගත නොහැකි වූ බැවින් ඒ එක් එක් නිවෙස්වල දුරකතන අංක ඔවුන්ගේ ප්‍රජාවේ ප්‍රධානී මගින් ලබාගත් අතර, දුරකතන සංවාද හරහා අවශ්‍ය දත්ත හා තොරතුරු ලබාගැනීමට හැකි විය. මෙම ක්‍රමවේද ප්‍රාථමික දත්ත රැස්කරනු ලබන ක්‍රම අතර ප්‍රචලිත ය (ගුණතිලක, 2016ඃ 24-26). පර්යේෂණ ආචාර ධර්මවලට අනුකූලව, විශේෂයෙන් ප්‍රාථමික දත්ත හා තොරතුරු රැස්කිරීමට පෙර ඒ සඳහා ඉදිරිපත් වූ

සියලු දෙනාගේ අනුමැතිය (Consent) ලබා ගන්නා ලදී. මූලික වශයෙන් කැෆ්ර් ජනතාවගේ තොරතුරු ලබා ගැනීම සඳහා පොත්පත්, සඟරා, වෙබ් අඩවි, ලිපි ආදි ද්විතීයික දත්ත මූලාශ්‍ර යොදාගන්නා ලදී. මීට අමතර ව ඔවුන්ගේ තොරතුරු ඇතුළත් ග්‍රාම නිලධාරී වාර්තා ද මෙම අධ්‍යයනය සඳහා දත්ත මූලාශ්‍රයක් ලෙස යොදාගෙන ඇත.

කැෆ්ර්වරුන්ගේ සමාජ සම්බන්ධතා පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී ප්‍රධාන වශයෙන් දත්ත විශ්ලේෂණය සමාජ ජාල විශ්ලේෂණ ක්‍රමවේදය මගින් UCINET (NETDROW; Ucinet 6 for Windows) මෘදුකාංගය භාවිතයෙන් කර ඇත. මේ යටතේ නිර්මාණය කරන ලද න්‍යාස, වගු හා ජාල සටහන් භාවිතයෙන් ඔවුන්ගේ සමාජ සම්බන්ධතාවල ස්වරූපයන් හා හැඩතල පිළිබඳ ව හඳුනාගත හැකි විය. එමෙන් ම සමස්ත කැෆ්ර් ප්‍රජාව තම ප්‍රජාව තුළ මෙන් ම බාහිර සමාජය සමඟ සම්බන්ධතා පවත්වන ආකාරය ප්‍රමාණාත්මක ව නිරූපණය කිරීමට මෙහි දී උත්සාහ ගෙන ඇත.

ප්‍රධාන විශ්ලේෂණ ක්‍රම කිහිපයක් යටතේ එම තොරතුරු විශ්ලේෂණය කර ඇත (Karunarathne and Lee, 2020).

i. ජාල ඝනත්වය (Network Degree Density)
ii. ජාල සමීපතාව (Network Closeness)
iii. ජාල සාමාන්‍යය (Network Average Degree)
iv. ජාල කේන්ද්‍රීයතාව (Network Degree Centerlity)
v. ජාල අන්තර්සම්බන්ධතාව (Network Betweeness)

මූලික වශයෙන් ම ප්‍රශ්නාවලිය ඇසුරින් එක්රැස් කරගන්නා ලද දත්ත හා තොරතුරු විශ්ලේෂණයට සුදුසු ලෙස සකස් කරගත යුතු වේ. ඒ සඳහා UCINET මෘදුකාංගය හරහා රැස්කරගත් දත්ත පරිවර්තන ක්‍රියාවලියකට ලක්කර විශ්ලේෂණය සඳහා සුදුසු ලෙස සකස් කරගත යුතු ය. Network Degree Density (ජාල ඝනත්වය) යනු සමාජ ජාල විශ්ලේෂණයේ දී වැදගත් විශ්ලේෂණ ක්‍රමයකි. මේ මඟින් ජනතාවගේ පවතින සම්බන්ධතාවල ශක්තිමත්භාවය හඳුනාගැනීමට හැකි වේ (Mac Ginty, 2010). කිසියම් පුද්ගලයෙකුට ඇති සාමාන්‍ය සම්බන්ධතා ප්‍රමාණය Network Average Degree (ජාල සාමාන්‍යය) මඟින් අධ්‍යයනය කර ඇති අතර පුද්ගලයන් අතර Network Degree Centerlity (ජාල කේන්ද්‍රීයතාවය) මිනුම් ක්‍රමය මඟින් සම්බන්ධතා පැවැත්වීමේ දී වැඩි ම සම්බන්ධතා ප්‍රමාණයකට සම්බන්ධ වන පුද්ගලයා හෝ පුද්ගලයන් පිළිබඳ ව අධ්‍යයනය කරයි (Hanneman & Riddle, 2005: 29; Karunarathne and Lee, 2020).


මේ අයුරින් ප්‍රධාන වශයෙන් සමාජ ජාල විශ්ලේෂණ ක්‍රම කිහිපයක් භාවිත කරමින් සමාජීය වශයෙන් ඔවුන් සිය සම්බන්ධතා පවත්වාගෙන යන ආකාරය පිළිබඳව මනාව අධ්‍යයනය කර ඇත.

## ආනුභවික ප්‍රතිඵල (Empirical Results)

සිලෝන් කැෆර් ප්‍රජාවගේ සමාජ සම්බන්ධතාවල ස්වරූපයන් පිළිබඳ මෙම කොටස තුළ සාකච්ඡාවට බඳුන්කොට ඇත. සිලෝන් කැෆර් ප්‍රජාව සමඟ සබඳතා පවත්වන සිංහල, දෙමළ සහ මුස්ලිම් යන ශ්‍රී ලාංකික ජන වර්ග හා සේවා නිලධාරීන්ගේ සම්බන්ධතාවන්හි ස්වරූපය පිළිබඳ ව මෙහි දී අවධානය යොමුකර ඇත. ඒ සඳහා රැස්කරන ලද ප්‍රාථමික දත්ත සමාජ ජාල විශ්ලේෂණය ඇසුරින් මිනුම්කර ඇති අතර ජාල ඝනත්වය, ඝනත්ව කේන්ද්‍රීයතාව, ජාල සමීපතා දර්ශකය, ජාල අන්තර්කේන්ද්‍රයතාව, ජාල සම්බන්ධතාව යන දර්ශකවල අගයයන් විශ්ලේෂණය කරන ලදී.

### සිංහල ජාතීන් සමඟ පවතින සම්බන්ධතාව

ශ්‍රී ලංකාවේ ජන වර්ගයන් අතර තවත් සුළු ජන කණ්ඩායමක් වන සිලෝන් කැෆර් ප්‍රජාව අද වනවිට ශ්‍රී ලාංකික ජන සමාජය තුළ හොඳින් සමාජානුයෝජනය වී සිටින ජන කණ්ඩායමක් වේ. ඔවුන්ගේ ජාල සම්බන්ධතාව ජාල ඝනත්වය අනුව ජාලගත කිරීමේ දී වැඩි සබඳතා පවත්වන්නේ තම අසල්වැසියන් හා දේවස්ථානය සම්බන්ධ පුද්ගලයන් සමඟ වන බව ජාල ප්‍රස්තාර අංක 1 අධ්‍යයනයේ දී කැපීපෙනෙන ලෙස හඳුනාගත හැකි ලක්ෂණයකි.




**ජාල ප්‍රස්තාර (Network Graph) අංක 1 :** කැෆර් ජනයා සිංහල ජාතීන් සමඟ පවත්වන සබඳතාවල ස්වරූපය

**සටහන්:** මෙහි රතු වර්ණයෙන් අසල්වාසීන් ද, කහ වර්ණයෙන් පල්ලියේ හිතවතුන් ද, නිල් වර්ණයෙන් පවුලේ ඥාතීන් ද, කොළ වර්ණයෙන් හිතවතුන් ද, දුඹුරු වර්ණයෙන් ළඟම මිතුරන් ද, රෝස වර්ණයෙන් කැෆර් ගෘහ ඒකකයන් ද නිරූපිත ය. වෘත්තවල (Nodes) විශාලත්වය ජාල ඝනත්වය අනුව තීරණය වී ඇත.

**මූලාශ්‍රයඃ** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත භාවිතයෙන් සමීක්ෂකයන් විසින් නිර්මාණය කරන ලදී, 2021.

ජාල ප්‍රස්තාර අංක 1ට අනුව අසල්වැසියන් සමග ඉතා හොඳ අන්තර් සම්බන්ධතාවක් පවත්වන ජන කොටසක් ලෙස සිලෝන් කැෆර් ජනයා හඳුනාගත හැකි ය. එම ජාලය තුළ අනෙක් වැඩි ම සබඳතා පවත්වන පිරිස වන්නේ කහ වර්ණයෙන් නිරූපිත පල්ලිය ආශ්‍රිත ව ඇසුරු කරන හිතවතුන් ය. දැඩි කිතුනු භක්තිකයන් වන සිලෝන් කැෆර්වරුන් දේවස්ථානය තුළ ඉතා ක්‍රියාකාරී පිරිසක් වේ. එබැවින් දේවස්ථානය තුළ පුද්ගලයන් සමඟ ද ඉතා හොඳ අන්තර්සම්බන්ධතාව පවත්වන බව හඳුනාගත හැකි ය.

වගු අංක 1: සිංහල - කැෆර් සම්බන්ධතා ජාලයේ ජාල ලක්ෂණ/මිනුම්

| | ජාල සනත්වය | ජාල සමීපතාව | ජාල අන්තර් සම්බන්ධතාව | | ජාල සනත්වය | ජාල සමීපතාව | ජාල අන්තර් සම්බන්ධතාව |
|---|---|---|---|---|---|---|---|
| Q1 | 0.238 | 0.500 | 0.008 | S1 | 0.500 | 0.646 | 0.089 |
| Q2 | 0.238 | 0.500 | 0.008 | S2 | 0.452 | 0.609 | 0.080 |
| Q3 | 0.214 | 0.488 | 0.014 | S3 | 0.476 | 0.627 | 0.085 |
| Q4 | 0.238 | 0.500 | 0.008 | S4 | 0.476 | 0.627 | 0.089 |
| Q5 | 0.238 | 0.500 | 0.022 | S5 | 0.500 | 0.646 | 0.094 |
| Q6 | 0.214 | 0.488 | 0.007 | S6 | 0.429 | 0.545 | 0.037 |
| Q7 | 0.238 | 0.500 | 0.015 | S7 | 0.429 | 0.545 | 0.041 |
| Q8 | 0.238 | 0.500 | 0.050 | S8 | 0.357 | 0.494 | 0.025 |
| Q9 | 0.214 | 0.488 | 0.028 | S9 | 0.381 | 0.506 | 0.030 |
| Q10 | 0.214 | 0.488 | 0.033 | S10 | 0.405 | 0.519 | 0.032 |
| Q11 | 0.167 | 0.467 | 0.027 | S11 | 0.119 | 0.433 | 0.010 |
| Q12 | 0.238 | 0.500 | 0.027 | S12 | 0.095 | 0.393 | 0.004 |
| Q13 | 0.143 | 0.457 | 0.008 | S13 | 0.048 | 0.347 | 0.000 |
| Q14 | 0.214 | 0.488 | 0.006 | S14 | 0.119 | 0.393 | 0.005 |
| Q15 | 0.238 | 0.500 | 0.015 | S15 | 0.071 | 0.372 | 0.001 |
| Q16 | 0.214 | 0.488 | 0.070 | S16 | 0.119 | 0.400 | 0.006 |
| Q17 | 0.214 | 0.488 | 0.007 | S17 | 0.048 | 0.359 | 0.000 |
| Q18 | 0.238 | 0.500 | 0.008 | S18 | 0.024 | 0.336 | 0.000 |
| Q19 | 0.190 | 0.477 | 0.005 | S19 | 0.024 | 0.331 | 0.000 |
| Q20 | 0.238 | 0.500 | 0.017 | S20 | 0.024 | 0.336 | 0.000 |
| Q21 | 0.238 | 0.500 | 0.116 | | | | |
| Q22 | 0.238 | 0.500 | 0.025 | | | | |
| Q23 | 0.238 | 0.500 | 0.029 | | | | |


**සටහන්:** මෙහි Q යන්නෙන් කැෆර් ගෘහ කුටුම්භ ද, S යන්නෙන් සිංහල ජාතීන් ද නිරූපණය කරයි.

**මූලාශ්‍රය :** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2020.

සිංහල ජාතිකයන් සමඟ ඔවුන්ගේ සම්බන්ධතා පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ඉතා ඉහළ ජාල සනත්වයක් සිංහල හා කැෆ්ර් ප්‍රජාව අතර පෙන්නුම් කරයි. එය 0.236ක් ලෙස වගු අංක 1 හි හඳුනාගත හැකි ය.

මීට අමතර ව සිංහල පවුල් හා විවාහයෙන් සම්බන්ධ වූ සිය පවුලේ ඥාතීන් සමඟ ද මිතුරන් බවට පත් වූ සිංහල ජාතීන් සමඟ ද වෙනත් හිතවතුන් සමඟ ද කැෆ්ර්වරුන් අන්තර් සම්බන්ධතා පවත්වන බව මේ මගින් පැහැදිලි වේ. අනෙකුත් සම්බන්ධතාවලට වඩා අසල්වාසීන් හා පල්ලියේ හිතවතුන් සමඟ ඇතිකරගත් සබඳතාවල ජාල සනත්ව අගය ඉතා ඉහළ අගයක් ගන්නා බව පැහැදිලි වේ. එනම්, අසල්වාසීන් සියල්ලන්ගේ ම සනත්ව අගයන් 0.452 - 0.5 අතර අගය පරාසයක් තුළ වෙනස්වන අතර පල්ලියේ හිතවතුන්ගේ සනත්ව අගය 0.357 - 0.429 ත් අතර විචලනය වේ. අනෙක් සියලු ම පුද්ගලයන්ගේ සබඳතා පැවැත්වීමේ ප්‍රමාණය 0.119 ට අඩු අගයක් ගනී. මෙම සමාජ ජාලය තුළ සමීපතා දර්ශකය හා අන්තර් සම්බන්ධතා දර්ශකය ද අසල්වාසීන්ගේ හා පල්ලියේ හිතවතුන්ගේ ඉතා ඉහළ අගයක් පෙන්නුම් කරයි. මෙම ජාල ප්‍රස්තාර හා ජාල මිනුම් නිර්මාණය කිරීම සඳහා යොදාගත් න්‍යාසය උපග්‍රන්ථ 2 හි දක්වා ඇත.

**දෙමළ ජාතීන් සමඟ පවතින සම්බන්ධතාව**




**ජාල ප්‍රස්තාර අංක 2 :** කැෆ්ර් ජනයා දෙමළ ජාතීන් සමඟ පවත්වන සබඳතාවල ස්වරූප

**සටහන්:** මෙහි රතු වර්ණයෙන් අසල්වාසීන් ද, කහ වර්ණයෙන් පල්ලියේ හිතවතුන් ද, නිල් වර්ණයෙන් පවුලේ ඥාතීන් ද, රෝස වර්ණයෙන් කැෆ්ර් ගෘහ ඒකකයන් ද නිරූපිත ය. වෘත්තවල (Nodes) විශාලත්වය ජාල සනත්වය අනුව තීරණය වී ඇත.

**මූලාශ්‍රය:** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2020. මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත භාවිතයෙන් සමීක්ෂකයන් විසින් නිර්මාණය කරන ලදී, 2021.

දෙමළ ජාතීන් හා කැෆර් ජාතීන් අතර පවතින සම්බන්ධතාව සනත්වය අනුව ජාල ප්‍රස්තාර අංක 2 මගින් නිරූපණය කර ඇත. මෙහි දී ද වැඩි ම සබඳතා පවත්වන්නේ අසල්වාසීන් හා පල්ලියේ හිතවතුන් සමග ය. සිංහල ජාතීන් මෙන් විශාල අසල්වාසීන් පිරිසක් නො සිටිය ද ගමේ දෙමළ පවුල් කිහිපයක් ජීවත්වන අතර ඔවුන් සමග ද සුහදත්වයෙන් කටයුතු කරන බව හඳුනාගත හැකි ය.

**වගු අංක 2: දෙමළ - කැෆර් සම්බන්ධතා ජාලයේ ජාල ලක්ෂණ**

| | ජාල සනත්වය | ජාල සමීපතාව | ජාල අන්තර් සම්බන්ධතාව | | ජාල සනත්වය | ජාල සමීපතාව | ජාල අන්තර් සම්බන්ධතාව |
|---|---|---|---|---|---|---|---|
| Q1 | 0.065 | 0.365 | 0.001 | T1 | 0.516 | 0.585 | 0.290 |
| Q2 | 0.129 | 0.477 | 0.011 | T2 | 0.452 | 0.544 | 0.264 |
| Q3 | 0.097 | 0.463 | 0.010 | T3 | 0.419 | 0.463 | 0.099 |
| Q4 | 0.065 | 0.425 | 0.003 | T4 | 0.516 | 0.508 | 0.167 |
| Q5 | 0.097 | 0.463 | 0.009 | T5 | 0.419 | 0.463 | 0.106 |
| Q6 | 0.129 | 0.477 | 0.011 | T6 | 0.032 | 0.326 | 0.000 |
| Q7 | 0.129 | 0.477 | 0.011 | T7 | 0.032 | 0.326 | 0.000 |
| Q8 | 0.161 | 0.508 | 0.026 | T8 | 0.032 | 0.326 | 0.000 |
| Q9 | 0.129 | 0.492 | 0.017 | T9 | 0.032 | 0.326 | 0.000 |
| Q10 | 0.097 | 0.477 | 0.010 | | | | |
| Q11 | 0.065 | 0.425 | 0.002 | | | | |
| Q12 | 0.129 | 0.492 | 0.017 | | | | |
| Q13 | 0.194 | 0.477 | 0.247 | | | | |
| Q14 | 0.129 | 0.492 | 0.017 | | | | |
| Q15 | 0.129 | 0.477 | 0.011 | | | | |
| Q16 | 0.065 | 0.425 | 0.002 | | | | |
| Q17 | 0.097 | 0.383 | 0.003 | | | | |
| Q18 | 0.129 | 0.492 | 0.017 | | | | |
| Q19 | 0.065 | 0.437 | 0.004 | | | | |
| Q20 | 0.129 | 0.477 | 0.011 | | | | |
| Q21 | 0.032 | 0.356 | 0.000 | | | | |
| Q22 | 0.129 | 0.492 | 0.017 | | | | |
| Q23 | 0.065 | 0.365 | 0.001 | | | | |

**සටහන්:** මෙහි Q යන්නෙන් කැෆර් ගෘහ කුටුම්භ ද, T යන්නෙන් දෙමළ ජාතීන් ද නිරූපණය කරයි.


**මූලාශ්‍රය:** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2020.

අසල්වාසීන්ගේ ජාල සනත්ව අගය T1 හි 0.516 හා T2 හි 0.452කි. අනිකුත් සබඳතා පවත්වන පුද්ගලයන්ට සාපේක්ෂ ව මෙය ඉතා ඉහළ අගයකි. T3,T4,T5

යන පල්ලියේ හිතවතුන්ගේ ද ඉහළ ජාල ඝනත්වයක් පෙන්නුම් කරයි. දෙමළ ජාතීන් සමඟ පවත්වන සම්බන්ධතාවයේ කැපීපෙනෙන ලක්ෂණයක් වන්නේ අනෙකුත් කැෆ්ර් කුටුම්බවලට වඩා වැඩි සබඳතා ප්‍රමාණයක් Q13 පවුල් ඒකකය තුළ හඳුනාගත හැකි ය. එයට හේතුව වන්නේ ඇය මන්නාරම් ප්‍රදේශයේ දමිළ පුද්ගලයෙක් විවාහ කරගත් අයෙක් වීමත්, එනිසා ම ඇය සිය සැමියාගේ ඥාතීන් සමඟ සබඳතා පැවැත්වීමත් ය. අනෙකුත් කැෆ්ර් කුටුම්බවලට සාපේක්ෂ ව 0.247 ක ඉහළ ජාල අන්තර් සම්බන්ධතා අගයක් ද මෙම කුටුම්බය තුළ හඳුනාගත හැකි ය (වගු අංක 2). මෙම ජාල ප්‍රස්තාර හා ජාල මිනුම් නිර්මාණය කිරීම සඳහා යොදාගත් න්‍යාසය උපග්‍රන්ථ 3 හි දක්වා ඇත.

**මුස්ලිම් ජාතීන් සමඟ පවතින සම්බන්ධතාව**

මුස්ලිම් ජාතීන් සමඟ කැෆ්ර් ජනයාගේ සම්බන්ධතා පැවැත්වීම පිළිබඳ අවධානය යොමුකිරීමේ දී ද හඳුනාගත හැකි තත්ත්වය වන්නේ අසල්වාසීන් සමඟ වැඩි සම්බන්ධතාවයක් පවත්වන බවයි (ජාල ප්‍රස්තාර අංක 3). සමීක්ෂිත දත්ත අනුව බොහෝ පුද්ගලයන් අතර සම්බන්ධතා පවත්වන බවක් මෙහි දී දැකිය නොහැකි ය. විශේෂයෙන් බොහෝ කුටුම්භ එක් මුස්ලිම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් දෙදෙනෙකු සමඟ පමණක් අන්තර් සම්බන්ධතා පවත්වන බව හඳුනාගත හැකි තත්ත්වයකි.




**ජාල ප්‍රස්තාර අංක 3 :** කැෆ්ර් ජනයා මුස්ලිම් ජාතීන් සමඟ පවත්වන සබඳතාවල ස්වරූපය

**සටහන්:** මෙහි රතු වර්ණයෙන් අසල්වාසීන් ද, කොළ වර්ණයෙන් හිතවතුන් ද, දුඹුරු වර්ණයෙන් ළඟ ම මිතුරන් ද, රෝස වර්ණයෙන් කැෆ්ර් ගෘහ ඒකකයන් ද නිරූපිත ය. වෘත්ත (Nodes) වල විශාලත්වය ජාල -ඝනත්වය අනුව තීරණය වී ඇත.

**මූලාශ්‍රය:** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත භාවිතයෙන් සමීක්ෂකයන් විසින් නිර්මාණය කරන ලදී, 2021.

| වගු අංක 3: මුස්ලිම් - කැෆ්ර් සම්බන්ධතා ජාලයේ ජාල ලක්ෂණ/මිනුම් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ජාල සනත්වය | ජාල සමීපතා | ජාල අන්තර් සම්බන්ධතා | | ජාල සනත්වය | ජාල සමීපතාව | ජාල අන්තර් සම්බන්ධතා |
| Q1 | 0.030 | 0.300 | 0.000 | M1 | 0.424 | 0.398 | 0.354 |
| Q2 | 0.061 | 0.367 | 0.021 | M2 | 0.424 | 0.418 | 0.427 |
| Q3 | 0.030 | 0.311 | 0.000 | M3 | 0.061 | 0.303 | 0.005 |
| Q4 | 0.061 | 0.306 | 0.011 | M4 | 0.030 | 0.297 | 0.000 |
| Q5 | 0.061 | 0.367 | 0.021 | M5 | 0.030 | 0.297 | 0.000 |
| Q6 | 0.061 | 0.311 | 0.025 | M6 | 0.030 | 0.175 | 0.000 |
| Q7 | 0.030 | 0.311 | 0.000 | M7 | 0.030 | 0.175 | 0.000 |
| Q8 | 0.152 | 0.393 | 0.158 | M8 | 0.030 | 0.252 | 0.000 |
| Q9 | 0.061 | 0.367 | 0.021 | M9 | 0.061 | 0.292 | 0.006 |
| Q10 | 0.030 | 0.300 | 0.000 | M10 | 0.030 | 0.252 | 0.000 |
| Q11 | 0.030 | 0.311 | 0.000 | M11 | 0.030 | 0.171 | 0.000 |
| Q12 | 0.061 | 0.367 | 0.021 | | | | |
| Q13 | 0.061 | 0.317 | 0.051 | | | | |
| Q14 | 0.030 | 0.311 | 0.000 | | | | |
| Q15 | 0.030 | 0.300 | 0.000 | | | | |
| Q16 | 0.030 | 0.300 | 0.000 | | | | |
| Q17 | 0.030 | 0.300 | 0.000 | | | | |
| Q18 | 0.061 | 0.176 | 0.002 | | | | |
| Q19 | 0.061 | 0.367 | 0.021 | | | | |
| Q20 | 0.061 | 0.317 | 0.051 | | | | |
| Q21 | 0.061 | 0.367 | 0.021 | | | | |
| Q22 | 0.061 | 0.324 | 0.028 | | | | |
| Q23 | 0.030 | 0.171 | 0.000 | | | | |

**මූලාශ්‍රය :** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2020.

**සටහන්:** මෙහි Q යන්නෙන් කැෆ්ර් ගෘහ කුටුම්භ ද, M යන්නෙන් මුස්ලිම් ජාතීන් ද නිරූපණය කරයි.

කැෆ්ර් පවුල් අතර තරමක් වැඩි අන්තර් සම්බන්ධතා පවත්වන එක් පවුලක් හඳුනාගත හැකි අතර Q8 ලෙස දක්වා ඇති එම පවුලේ අන්තර්සම්බන්ධතා දර්ශකය 0.158ක් ලෙස ඉහළ අගයක් හඳුනාගත හැකි ය. මුස්ලිම් ජනයා අතර සමීපතා දර්ශකය ඉහළ අගයක් ගන්නේ M2 ලෙස දැක්වෙන අසල්වැසියා වන අතර එය 0.418 කි. M1 යන අසල්වැසියා 0.398ක ජාල සමීපතා අගයක් පෙන්නුම් කරයි. එම අසල්වැසියන් දෙදෙනාගේ ම ජාල සනත්ව අගය 0.424ක් වේ. සමස්ත ජාලය තුළ ම කැපීපෙනෙන ඉහළ ජාල සනත්ව අගයක් මෙන් ම ජාල අන්තර් සම්බන්ධතා අගයක් ද M1 සහ M2 යන පුද්ගලයන් පෙන්නුම් කරයි. ඊට අමතර ව හිතවතුන් හා මිතුරන්

ලෙස ද පිරිසක් හඳුනාගත හැකි ය. කෙසේ නමුත් බොහෝ කැෆ්ර් කුටුම්භ මෙම ජාලය තුළ එතරම් ක්‍රියාකාරී නොවන බව හඳුනාගත හැකි විශේෂ ලක්ෂණයකි (ජාල ප්‍රස්තාර අංක 3) මෙම ජාල ප්‍රස්තාර හා ජාල මිනුම් නිර්මාණය කිරීම සඳහා යොදාගත් න්‍යාසය උපග්‍රන්ථ 4 හි දක්වා ඇත.

| **වගු අංක 4: සිංහල, දෙමළ, මුස්ලිම් ජාතීන්ට අදාළ සම්බන්ධතා ජාලවල සංක්ෂිප්ත ජාල ලක්ෂණ/මිනුම්** | | | |
|---|---|---|---|
| | සිංහල | දෙමළ | මුස්ලිම් |
| ජාල ඝනත්ව සාමාන්‍ය අගය | 9.907 | 4.750 | 2.265 |
| ජාල ඝනත්ව අගය | 0.236 | 0.153 | 0.069 |
| ජාල කේන්ද්‍රීයතා දර්ශකය | 0.276 | 0.387 | 0.377 |
| ජාල ඝනත්ව දුර දර්ශකය* | 2.138 | 2.296 | 2.588 |

**මූලාශ්‍රය:** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2020.

**සටහන්: *** මෙම අගය සාපේක්ෂව ඉහළ යත් ම සම්බන්ධතාවන්හි දුරස්ථභාවය ඉහළ වේ.

**ජාතීන් සමඟ පවතින සමාජ සම්බන්ධතාවල සමස්ත සන්දර්භය**

කැෆ්ර් ප්‍රජාව මෙලෙස අනෙක් ජාතීන් සමඟ පවත්වන සම්බන්ධතාව සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි විශේෂ ලක්ෂණය වන්නේ ඉහළ ජාල ඝනත්වයක් හිමිකරගෙන ඇත්තේ සිංහල ජාතීන් වීමයි. එය 0.236ක් ලෙස වගු අංක 4 හි පැහැදිලි ව හඳුනාගත හැකි ය. කැෆ්ර් ප්‍රජාව ජනාවාසගත වී ඇති ප්‍රදේශයේ වැඩි පිරිසක් සිංහල ජාතීන් වීම මෙයට හේතුව වී ඇතැයි නිගමනය කළ හැකි ය.


උක්ත වගු අංක 4 ට අනුව ඝනත්ව කේන්ද්‍රීයතා අගය සලකා බැලීමේ දී 0.387ක ඉහළ ම අගයක් ගනු ලබන්නේ දෙමළ ජාතිකයන් විසිනි. කැෆ්ර් ජාතිකයින් සියලු ම දෙනා සම්බන්ධතා පවත්වන්නේ සීමාසහිත දෙමළ ජාතික පිරිසක් සමඟ වීම මෙයට හේතුවයි. අනෙකුත් ජාතීන් මෙන් සබඳතා පවත්වන එක් එක් පවුලට වෙනස් වූ පුද්ගලයන් රාශියක් දමිළ ජාතීන් අතර නොමැති වන අතර කැෆ්ර් ජාතීන් බොහෝ දෙනා සබඳතා පවත්වන්නේ අසල්වැසි දෙමළ පුද්ගලයන් කිහිපදෙනා හා පල්ලියේ දෙමළ හිතවතුන් කිහිපදෙනෙකු සමඟ පමණි. මෙම තත්ත්වයෙන් පරිබාහිර සබඳතා පවත්වන කැෆ්ර් ජාතික එක් කුටුම්බයක් පමණක් හඳුනාගත හැකි අතර ඒ ඥාති සම්බන්ධතා පවත්වන මන්නාරම් ප්‍රදේශයෙන් විවාහයක් කරගත් කාන්තාවයි. අනෙකුත් සියලු කැෆ්ර් කුටුම්බ අඩු වැඩි වශයෙන් අසල්වාසීන් හා පල්ලියේ හිතවතුන් කිහිපදෙනෙකු සමඟ පමණක් සබඳතා පවත්වයි.

සිංහල ජාතීන් සබඳතා පවත්වන පුද්ගලයන් පරාසය ඉතා වැඩි බැවින් මෙම ජාල කේන්ද්‍රීයතා අගය 0.276ක් ලෙස අනෙකුත් ජන කොටස්වලට වඩා අඩු අගයක් වාර්තා කරයි. අසල්වාසීන් හා පල්ලියේ හිතවතුන්ට අමතරව සිංහල පවුල් හා විවාහ

වූ පිරිස් සිය පවුලේ ඥාතීන් සමඟ ද, ඇතැම් පිරිස් තම පාසල් සමයේ මිතුරන් සමඟ ද, තවත් පිරිස් රැකියා ස්ථාන ආශ්‍රිත මිතුරන් හා හිතවතුන් සමඟ ද, ආදී ලෙස පුළුල් පරාසයක සබඳතා ගොඩනඟාගෙන ඇත. ඒ නිසා ඔවුන්ගේ සබඳතා විශාල පරාසයක බෙදී යාම හේතුවෙන් මෙම අගය අඩුවීමක් හඳුනාගත හැකි ය.

ජාල සනත්ව දුර දර්ශකය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සිංහල, දෙමළ හා මුස්ලිම් යන ජාතීන් ත්‍රිත්වය අතර වැඩි සබඳතා දුරක් පවතින්නේ මුස්ලිම් ජාතීන් සමඟ බව හඳුනාගත හැකි ය. මෙම දර්ශකයේ දී අදහස් කරන්නේ භූගෝලීය දුර සබඳතාවක් පිළිබඳ නොවේ. සබඳතා පැවැත්වීමේ දී අඩු ම සබඳතා ප්‍රමාණයක් හඳුනාගත හැකි වන්නේ මුස්ලිම් ජාතීන් සමඟ වන අතර ජාල සනත්වය ද 0.069ක් තරම් ඉතා අඩු අගයක් ගනී. මෙහි දී බොහෝ කැෆ්ර් කුටුම්බ එක් මුස්ලිම් පුද්ගලයෙකු හෝ දෙදෙනෙකු වැනි ඉතා සුළු පිරිසක් සමඟ සිය සමාජ සබඳතා ගොඩනගාගෙන ඇත. මුස්ලිම් - කැෆ්ර් සමාජ ජාලයේ සාමාන්‍ය අගය ද 2.265 ක් ලෙස සාපේක්ෂ අඩු අගයක් පෙන්නුම් කරයි (වගු අංක 4).

සිංහල හා දෙමළ යන ජාතීන් දෙක ම මුස්ලිම් ජනතාවට වඩා කැෆ්ර් ප්‍රජාව සමඟ විශාල සබඳතා ජාලයක හවුල්කරුවන් බව ද ජාල ප්‍රස්තාර අංක 4 හි පැහැදිලි ව හඳුනාගත හැකි වෙනස්කමකි.




**ජාල ප්‍රස්තාර අංක 4:** කැෆ්ර් ජනයා සිංහල, දෙමළ හා මුස්ලිම් ජාතීන් ත්‍රිත්වය සමඟ පවත්වන සබඳතාවල ස්වරූපය

**සටහන්:** මෙහි රතු වර්ණයෙන් අසල්වාසීන් ද, කහ වර්ණයෙන් පල්ලියේ හිතවතුන්

ද, නිල් වර්ණයෙන් පවුලේ ඥාතීන් ද, කොළ වර්ණයෙන් හිතවතුන් ද, දුඹුරු වර්ණයෙන් ළඟම මිතුරන් ද, රෝස වර්ණයෙන් කැෆ්ර් ගෘහ ඒකකයන් ද නිරූපිත ය. වෘත්තවල (Nodes) විශාලත්වය ජාල ඝනත්වය අනුව තීරණය වී ඇත.

**මූලාශ්‍රයඃ** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත භාවිතයෙන් සමීක්ෂකයා විසින් නිර්මාණය කරන ලදී. 2021.

යථෝක්ත ප්‍රස්තාර 4 හි සමාජ ජාල සටහන් අනුව හා වගු අංක 4 හි සංඛ්‍යා දත්ත අනුව සිංහල, දෙමළ හා මුස්ලිම් යන ජාතීන් ත්‍රිත්වය සමඟ ශ්‍රී ලාංකිකයන් අප්‍රිකානු ප්‍රජාව සමාජ සබඳතා පවත්වාගෙන යන ආකාරයේ වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කළ හැකි ය.

**සේවා නිලධාරීන් සමඟ පවතින සම්බන්ධතාව**

ප්‍රදේශයේ සිටින සේවා නිලධාරීන් සමඟ කැෆ්ර් ජනයා සබඳතා පවත්වන ආකාරය සාකච්ඡා කිරීමේ දී කැෆ්ර් සහ සේවා නිලධාරීන් අතර පවතින සබඳතාවන්හි සමාජ ජාල ඝනත්වය 0.240 ක අගයක් පෙන්නුම් කරයි (වගු අංක 5).

| වගු අංක 5ඃ සේවා නිලධාරී - කැෆ්ර් සම්බන්ධතා ජාලයේ සංක්ෂිප්ත ජාල ලක්ෂණ/මිනුම් | |
|---|---|
| ජාල සාමාන්‍යය අගය | 7.667 |
| ජාල ඝනත්ව අගය | 0.240 |
| ජාල කේන්ද්‍රීයතා දර්ශකය | 0.505 |
| ජාල ඝනත්ව දුර දර්ශකය | 1.975 |


**මූලාශ්‍රයඃ** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2020.

සේවා නිලධාරීන් අතරින් ග්‍රාම නිලධාරීතුමිය (GNO) ඉහළ සබඳතා ඝනත්ව අගයක් හිමිකරගෙන ඇති අතර එය 0.719 කි. ඒ හා සමාන ම ඉහළ ඝනත්ව අගයක් එනම් 0.667 ක අගයක් පල්ලියේ පියතුමා (F) සම්බන්ධ ව හඳුනාගත හැකි ය. විශේෂයෙන් ග්‍රාමය තුළ පොදු කටයුතුවල දී සිලෝන් කැෆ්ර්වරුන්ගේ ප්‍රජා සහභාගීත්වය ඉතා ඉහළ මට්ටමක පවතින බව ග්‍රාමසේවකතුමිය සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාව මඟින් හඳුනාගත් කරුණකි. පල්ලිය තුළ කටයුතුවල දී ද එම තත්ත්වය එසේ ම ය. සහයෝගිත්වයෙන් යුතුව එකිනෙකා සමඟ කටයුතු කරන ජන කොටසක් ලෙස මොවුන් හඳුනාගත හැකි ය. එවැනි පොදු කටයුතුවල දී ඇතැම්විට ඔවුන්ගේ අනන්‍යතා ලක්ෂණ සුළු අපහසුතාවලට ලක්වීමට හේතු වුව ද අද වන විට එම තත්ත්වය බොහෝදුරට අඩු බවක් කැෆ්ර් ප්‍රජා නායිකාව විසින් සඳහන් කරන ලදී. විශේෂයෙන් ම මෙවැනි තත්ත්වයන් ඔවුන් බොහෝවිට අත්විඳින්නේ ග්‍රාමයෙන් පිටතදී බවත් ගම තුළ සියල්ලන් සමඟ ඔවුන් හොඳ සහයෝගයෙන් ජීවත්වන බවත් ඇය තවදුරටත් දැක්වීය.

මෙවන් අවස්ථාවන්වල දී ග්‍රාමසේවකතුමිය, සිරම්බිඅඩිය පල්ලියේ පියතුමා මෙන් ම පන්සලේ ස්වාමීන් වහන්සේ ද ඉතාමත් හොඳ සහයෝගයක් ලබාදෙන බවත් ඔවුහු සඳහන් කරති. කැෆ්ර් ප්‍රජාවගෙන් වැඩිදෙනා කිතුනු භක්තිකයන් වුවත්

පන්සලේ ස්වාමීන් වහන්සේ සමඟ ද සමාජ සම්බන්ධතාවක් ගොඩනගාගෙන ඇති බව හඳුනාගත හැකි ලක්ෂණයකි. ඒ අනුව පන්සලේ ස්වාමීන් වහන්සේ (BM) සම්බන්ධ ව ද 0.563 ක් වැනි ඉහළ ජාල ඝනත්වයක් හඳුනාගත හැකි ය. තමාගේ පරම්පරාවන්ට ඇතින් හෝ සම්බන්ධ අය සමඟ මෙන් ම තමාගේ වරිගයට සම්බන්ධ නැතත් වඩාත් ළඟැඟි යැයි හඳුනාගත් අය හා සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීම කෙරෙහි මානවයා ලැදියාවක් දක්වන බව පර්යේෂණයන්ගෙන් ප්‍රත්‍යක්ෂ වී ඇති කාරණයකි (Stadtfeld, Takács, and Vörös, 2020).

එමෙන් ම සිලෝන් කැෆ්ර් ප්‍රජාව සතු සුවිශේෂී සංස්කෘතික අනන්‍යතාව හේතුවෙන් ප්‍රදේශයේ සංස්කෘතික නිලධාරීතුමිය (CO) සමඟ ද නිතර නිතර සම්බන්ධතා පවත්වන බව හඳුනාගත හැකි ය. තව ද සිරම්බිඅඩිය සිංහල විද්‍යාලයේ විදුහල්පති තුමාගේ (P(S)) ජාල ඝනත්ව අගය 0.531 ක් හා ග්‍රාම සංවර්ධන නිලධාරීතුමාගේ (DO) සම්බන්ධතා ප්‍රමාණය සම්බන්ධ ජාල ඝනත්ව අගය 0.406 ක් ලෙස දැක්විය හැකි ය. ඔවුන් ද ප්‍රදේශය තුළ පොදු කාර්යයන්වල දී හොඳ සහයෝගයක් ලබාදෙන පුද්ගලයන් ලෙස පෙන්වාදිය හැකි ය.





**ජාල ප්‍රස්තාර අංක 5:** කැෆ්ර් ජනයා සේවා නිලධාරීන් සමඟ පවත්වන සබඳතාවෙහි ස්වරූපය

**සටහන්:** මෙහි රතු වර්ණයෙන් ග්‍රාම සේවක, නිල් වර්ණයෙන් පල්ලියේ පියතුමා, කහ වර්ණයෙන් පන්සලේ ස්වාමීන් වහන්සේ, ලා රතු වර්ණයෙන් සිරම්බිඅඩිය සිංහල විද්‍යාලයේ විදුහල්පති, දුඹුරු වර්ණයෙන් සංස්කෘතික නිලධාරී, ලා නිල් වර්ණයෙන් ග්‍රාම සංවර්ධන නිලධාරී, දම් වර්ණයෙන් ප්‍රාදේශීය ලේකම්, ලා දම් වර්ණයෙන් සිරම්බිඅඩිය කනිටු විදුහලේ විදුහල්පති, අළු වර්ණයෙන් පවුල් සෞඛ්‍ය සේවිකා, කොළ වර්ණයෙන් පුත්තලම ඇන්ඩෲ විද්‍යාලයේ විදුහල්පති, රෝස වර්ණයෙන් කැෆ්ර් ගෘහ ඒකකයන් ද නිරූපිත ය. වෘත්තවල (Nodes) විශාලත්වය ජාල ඝනත්වය අනුව තීරණය වී ඇත.

**මූලාශ්‍රයඃ** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත භාවිතයෙන් සමීක්ෂකයා විසින් නිර්මාණය කරන ලදී, 2021.

මීට අමතර ව ප්‍රාදේශීය ලේකම්තුමා (AG) 0.25ක සනත්වයක් පෙන්නුම් කරන ආකාරයක් හඳුනාගත හැකි ය. ඍජු ව සෑම කැෆර් කුටුම්බයක් සමඟ ම සම්බන්ධතා නොපවත්වන බැවින් සහ විශේෂයෙන් කැෆර් ප්‍රජා නායිකාව හා කැෆර් සංගීත කණ්ඩායමේ සාමාජිකයන් සමඟ වැනි සුළු පිරිසක් සමඟ පමණක් ප්‍රාදේශීය ලේකම්තුමා සබඳතා පැවැත්වීම මෙවැනි සනත්ව අගයක් හඳුනාගැනීමට හේතුව ලෙස දැක්විය හැකි ය. එමෙන් ම සිරම්බිඅඩිය කනිටු විදුහලේ විදුහල්පතිතුමා (P(K)) ද කැෆර් ප්‍රජාව සමඟ යම් සබඳතා ප්‍රමාණයක් ගොඩනගාගෙන ඇත (0.313). එමෙන් ම පවුල් සෞඛ්‍ය සේවිකාව 0.094ක සබඳතා සනත්වයක් පෙන්නුම් කරන ආකාරය හඳුනාගත හැකි ය. ජාලය තුළ අඩු ම සනත්ව අගය (0.031) නිරූපණය කරන්නේ පුත්තලම ඇන්ඩෲ විද්‍යාලයේ විදුහල්පතිවරයා (P(A)) වන අතර එම විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන එක් සිසුවෙක් කැෆර් ප්‍රජාව අතර වන බැවින් එම කුටුම්බයේ සාමාජිකයන් එම විදුහල්පතිවරයා සමඟ සබඳතා පවත්වන බවක් සඳහන් වේ (වගු අංක 6).

මේ අයුරින් එක් එක් සේවා නිලධාරියාගේ සනත්ව අගයන් පිළිබඳ හඳුනාගත හැකි අතර කැෆර් කුටුම්භ අතර වැඩි ම සබඳතා පවත්වන කුටුම්භ දෙකක් හඳුනාගත හැකි ය. එම ගෘහ කුටුම්භ දෙකෙහි ම සනත්ව අගය 0.25 ක් වේ (වගු අංක 6). සේවා නිලධාරීන්ගේ ජාල සනත්ව අගයන් අනුව සබඳතා ප්‍රමාණයන්ගේ වෙනස්කම් රූප සටහන් අංක 6 හි පැහැදිලි ව හඳුනාගත හැකි ය.




**ජාල ප්‍රස්තාර අංක 6ඃ** කැෆර් ජනයා හා සේවා නිලධාරීන් සමඟ පවතින සබඳතාවෙහි වෙනස්කම්

**සටහන්ඃ** මෙහි රතු වර්ණයෙන් ග්‍රාම සේවක, නිල් වර්ණයෙන් පල්ලියේ පියතුමා, කහ වර්ණයෙන් පන්සලේ ස්වාමීන් වහන්සේ, ලා රතු වර්ණයෙන් සිරම්බිඅඩිය සිංහල විද්‍යාලයේ විදුහල්පති, දුඹුරු වර්ණයෙන් සංස්කෘතික නිලධාරී, ලා නිල්

වර්ණයෙන් ග්‍රාම සංවර්ධන නිලධාරී, දම් වර්ණයෙන් ප්‍රාදේශීය ලේකම්, ලා දම් වර්ණයෙන් සිරම්බිඅඩිය කනිටු විදුහලේ විදුහල්පති, අළු වර්ණයෙන් පවුල් සෞඛ්‍ය සේවිකා, කොළ වර්ණයෙන් පුත්තලම ඇන්ඩෲ විද්‍යාලයේ විදුහල්පති, රෝස වර්ණයෙන් කැෆර් ගෘහ ඒකකයන් ද නිරූපිත ය. වෘත්තවල (Nodes) විශාලත්වය ජාල සනත්වය අනුව තීරණය වී ඇත.

**මූලාශ්‍රයඃ** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත භාවිතයෙන් සමීක්ෂකයා විසින් නිර්මාණය කරන ලදී, 2021.

මොවුන්ගේ අන්තර්සබඳතා ප්‍රමාණය පිළිබඳ ව හඳුනාගැනීමේ දී ද ඉහළ අන්තර්සබඳතා අගයක් ග්‍රාම නිලධාරී හා පල්ලියේ පියතුමා පෙන්නුම් කරන අතර ඇන්ඩෲ විද්‍යාලයේ විදුහල්පතිතුමාගේ අන්තර්සබඳතා ප්‍රමාණය ශූන්‍ය අගයක් ගනී. ඒ බව රූපසටහන් අංක 5 හි පැහැදිලි ව හඳුනාගත හැකි ය. එහි ප්‍රධාන ජාලයෙන් ඈත්ව P(A) ලෙස දැක්වෙන්නේ ඇන්ඩෲ විදුහලේ විදුහල්පතිතුමාගේ ජාලය සම්බන්ධතාව වන අතර ඔහු සමස්ත කැෆර් ප්‍රජාව සමඟ ඉතාමත් අඩු සම්බන්ධතාව පවත්වන පුද්ගලයෙක් බව හඳුනාගත හැකි ය. මෙම සබැඳියාවන්හි මානයන් මානව විද්‍යාත්මකව ද අධ්‍යයනය කළ යුතු ය. මක්නිසාද යත් මෙවැනි පර්යේෂණ අනාවර්ණයන් අප සමාජයට ඉතා අගනා මෙන්ම සමාජය අපේක්ෂා කරන්නන්ද වේ (අත්තනායක, 2016). විශේෂයෙන් එම ජන කොටස කාලයාගේ ඇවෑමෙන් විශාල පරිවර්තනයන් හා පරිණාමයන් ට ලක්වන බැවිණි (සමරවික්‍රම, 2018). එමෙන් ම, එම පරිණාමයන් තුළ විවිධ වූ හැල හැප්පීම්වලට භාජනය වීමේ සන්දර්භයක් සහ වටපිටාවක් ද හඳුනා ගැනීමට හැකිවීම සමාජ ජාලයන් ගොඩනැගීමේ ක්‍රියාවලිය තුළ සාමාන්‍ය තත්ත්වයකි (Stadtfeld, Takács, and Vörös, 2020).

**වගු අංක 6ඃ සේවා නිලධාරී - කැෆර් සම්බන්ධතා ජාලයේ ජාල ලක්ෂණ**

| | ජාල සනත්වය | ජාල සමීපතාව | ජාල අන්තර් සම්බන්ධතාව | | ජාල සනත්වය | ජාල සමීපතාව | ජාල අන්තර් සම්බන්ධතාව |
|---|---|---|---|---|---|---|---|
| Q1 | 0.219 | 0.533 | 0.012 | GN | 0.719 | 0.780 | 0.200 |
| Q2 | 0.219 | 0.533 | 0.014 | AG | 0.250 | 0.438 | 0.015 |
| Q3 | 0.219 | 0.53 | 0.012 | DO | 0.406 | 0.508 | 0.043 |
| Q4 | 0.188 | 0.516 | 0.007 | CO | 0.438 | 0.542 | 0.065 |
| Q5 | 0.156 | 0.500 | 0.007 | M | 0.094 | 0.386 | 0.002 |
| Q6 | 0.156 | 0.500 | 0.005 | F | 0.688 | 0.744 | 0.183 |
| Q7 | 0.219 | 0.533 | 0.015 | BM | 0.563 | 0.604 | 0.097 |
| Q8 | 0.250 | 0.552 | 0.02 | P(S) | 0.531 | 0.604 | 0.095 |
| Q9 | 0.219 | 0.533 | 0.015 | P(K) | 0.313 | 0.464 | 0.024 |
| Q10 | 0.188 | 0.516 | 0.025 | P(A) | 0.031 | 0.337 | 0.000 |
| Q11 | 0.250 | 0.552 | 0.038 | | | | |
| Q12 | 0.094 | 0.471 | 0.001 | | | | |
| Q13 | 0.156 | 0.5 | 0.005 | | | | |
| Q14 | 0.125 | 0.485 | 0.002 | | | | |

| | | | |
|---|---|---|---|
| Q15 | 0.188 | 0.516 | 0.009 |
| Q16 | 0.125 | 0.485 | 0.002 |
| Q17 | 0.156 | 0.5 | 0.065 |
| Q18 | 0.188 | 0.516 | 0.024 |
| Q19 | 0.125 | 0.485 | 0.003 |
| Q20 | 0.188 | 0.516 | 0.007 |
| Q21 | 0.094 | 0.471 | 0.001 |
| Q22 | 0.156 | 0.5 | 0.008 |
| Q23 | 0.156 | 0.5 | 0.006 |

**සටහන්:** මෙහි Q යන්නෙන් කැෆ්ර් ගෘහ කුටුම්භ ද, GN යන්නෙන් ග්‍රාම සේවක, F යන්නෙන් පල්ලියේ පියතුමා, BM යන්නෙන් පන්සලේ ස්වාමීන් වහන්සේ, P(S) යන්නෙන් සිරම්බිඅඩිය සිංහල විද්‍යාලයේ විදුහල්පති, CO යන්නෙන් සංස්කෘතික නිලධාරී, DO යන්නෙන් ග්‍රාම සංවර්ධන නිලධාරී, AG යන්නෙන් ප්‍රාදේශීය ලේකම්, P(K) යන්නෙන් සිරම්බිඅඩිය කනිටු විදුහලේ විදුහල්පති, M යන්නෙන් පවුල් සෞඛ්‍ය සේවිකා, P(A) යන්නෙන් පුත්තලම ඇන්ඩෘ විද්‍යාලයේ විදුහල්පති නිරූපණය කරයි.

**මූලාශ්‍රය:** ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත, 2020.

කැෆ්ර් ප්‍රජාව හා සේවා නිලධාරීන් අතර සමීපතා අගයන් සාපේක්ෂව සුළු අගය පරාසයක් තුළ විචලනය වන බව හඳුනාගත හැකි වේ. ඊට හේතුව වන්නේ සමස්ත කැෆ්ර් ප්‍රජාව සේවා සම්බන්ධතා පවත්වන විශාල සේවා නිලධාරීන් ප්‍රමාණයක් නො සිටින බැවින් ගෘහ කුටුම්භ 32 ම සේවා නිලධාරීන් දහදෙනකු වැනි සුළු පිරිසක් සමඟ ඔවුන්ගේ සබඳතා ජාලය පවත්වාගෙන යන බැවිනි. මෙම ජාල ප්‍රස්තාර හා ජාල මිනුම් නිර්මාණය කිරීම සඳහා යොදාගත් න්‍යාසය උපග්‍රන්ථ 5 හි දක්වා ඇත.

මේ අයුරින් සිලෝන් කැෆ්ර් ජනතාව ප්‍රදේශයේ සේවා නිලධාරීන් සමඟ පවත්වන සමාජ සම්බන්ධතාව විශ්ලේෂණාත්මකව පෙන්වාදිය හැකි ය. සමාජ ජාල විශ්ලේෂණය ඇසුරු කරගනිමින් ලබාගත් තොරතුරු සියල්ලෙහි සාරාංශයක් ලෙස සමස්ත කැෆ්ර් ප්‍රජාව වර්තමානය වනවිට ඉහළ සමාජ සම්බන්ධතා ගොඩනගාගනිමින් ශ්‍රී ලාංකීය සමාජයට වඩාත් අනුගතවෙමින් ජීවත්වන ජන කොටසක් බව පෙන්වාදිය හැකි ය. මෙම පරිකල්පනයන් අතීත අත්දැකීම් හා සැසඳීමේදී මනාව ගම්‍යමාන වේ (සෝමසුන්දර, 2007:81; පියසේන, 1966:93; කුරුලුවංශ, සහ පූර්ණිමාල්, 2017:21). එමෙන්ම ශ්‍රී ලාංකීය ජන සමාජය සමාජ සබැඳියාවන් හා සමාජ සංවිධාන ගොඩනගා ගැනීම අතින් ඉතා පොහොසත් ය යන්න මොනවට ගම්‍යමාන වී ඇත (Karunarathne and Lee, 2020). ඊට අමතරව, ශ්‍රී ලාංකීය ජන සමාජය සමාජ ප්‍රාග්ධනයෙන් ද (සමාජ ප්‍රාග්ධනය සමාජ ජාල හරහා තිරිහන් වන බැවිනි) සතුටුදායක ලෙස පොහොසත් ය (Karunarathne and Lee, 2019).

## නිගමන

පුත්තලම සිරම්බිඅඩිය ග්‍රාම නිලධාරී වසම තුළ ජනාවාසගත වී සිටින ශ්‍රී ලාංකික අප්‍රිකානු ජනයා පිළිබඳ සිදු කළ සමාජ ජාල විශ්ලේෂණයන් ඇසුරින් එළඹිය හැකි නිගමනයන් හා යෝජනා මෙහි දී සාකච්ඡා කරනු ලැබේ. මෙම අධ්‍යයනය වඩාත් කාලෝචිත වන්නේ ඔවුන් ශීඝ්‍රයෙන් වඳවීගෙන යන ශ්‍රී ලාංකීය ජනකොටසක් බැවිනි (පෙරේරා, 2017:177; දිසානායක, 1996:111).

සමාජ ජාල විශ්ලේෂණයට අනුව කැෆ්ර්වරුන්ගේ සමාජ සම්බන්ධතා පිළිබඳ එළැඹිය හැකි නිගමනය වන්නේ ඔවුන් සබඳතා ගොඩනගාගෙන සිටින වෙනත් ජාතීන් අතර සිංහල ජාතීන් ඉහළ ස්ථානයක් හිමිකරගෙන ඇති බවයි. අනෙකුත් ජාල සම්බන්ධතාවලට සාපේක්ෂව 0.236ක ඉහළ ජාල ඝනත්ව අගයක් සහිත ජාලයක් සිංහල - කැෆ්ර් ජාතීන් අතර හඳුනාගත හැකි ය. සියලු ජාතීන් අතර අසල්වැසියන් සමඟ ඉහළ සබඳතා ගොඩනඟාගෙන ඇති අතර ඊට අමතර ව සිංහල හා දෙමළ කතෝලික දේවස්ථාන ආශ්‍රිත පුද්ගලයන් ද කැෆ්ර්වරුන්ගේ සමාජ සම්බන්ධතා ජාලවල වැඩි වැදගත්කමක් ලබාගෙන ඇති පිරිස වේ. එමෙන් ම මීට අමතර ව ඥාති සම්බන්ධතා මත වෙනත් ජාතීන් සමඟ ගොඩනගාගත් සම්බන්ධතා ද, මිතුරන් ලෙස ඇසුරු කරන වෙනත් ජාතීන් ද ඔවුන්ගේ සම්බන්ධතා ජාලය තුළ හඳුනාගත හැකි ය.

ශ්‍රී ලාංකික ජන සමාජය තුළ සුළු ජාතියක් ලෙස සේවා නිලධාරීන් සමඟ පවා තරමක හොඳ සබඳතා ජාලයක් ඇසුරෙන් ගොඩ නගාගෙන ඇති අතර එහි දී වැඩි ම සබඳතා ප්‍රමාණයක් ග්‍රාම නිලධාරී හා පල්ලියේ පියතුමා සමඟ ගොඩනගාගෙන ඇත. ගමේ පොදු කාර්යයන්වල දී ආගම් හා ජාති භේදයකින් තොරව ගමේ සියලුදෙනා සමඟ ඉතා සහයෝගයෙන් කටයුතු කරන පිරිසක් වන අතර ඇතැම් අවස්ථාවල සුළු අපහසුතාවන්ට ලක්වුව ද (Akmeemana, and Kamalrathne, 2020; විජයවර්ධන, 2021:66), ඒවා නොතකමින් ජීවත්වීමට ඔවුන් අද වනවිට පුරුදුව ඇත (Jayasuriya, 2005; Jayawardene, 2013; Jayasuriya, 2007). ඒ අනුව මෙම අධ්‍යයනය සමාජ ජාල ඥාන විමංසා සාහිත්‍ය (literature of social networks epistemology) සන්දර්භයට නව දායකත්වයක් එක්කරනු ඇත.

ශ්‍රී ලාංකික සුළු ජන පිරිසක් ලෙස අතීතයට සාපේක්ෂව වර්තමාන කැෆ්ර් ජනයාගේ සමාජ සම්බන්ධතාවයන් තරමක පුළුල් පරාසයක පැතිර ඇති නමුත් අනිකුත් ජන කොටස්වලින් ඇතැම් අවස්ථාවල දී අපහසුතාවන්ට ලක්වන බව හඳුනාගත් තත්ත්වයකි (ගුණවර්ධන, 2019:72; නිමන්ත, 2020:41). මේ සඳහා දැක්විය හැකි හොඳ ම යෝජනාව වන්නේ මිනිස් ආකල්ප සංවර්ධනයයි. ග්‍රාමීය මට්ටමේ සිට මිනිස් ආකල්ප සංවර්ධන අවස්ථා හා වැඩසටහන් ඇති කිරීම වර්තමානය වනවිට වැදගත් අවශ්‍යතාවක් බවට පත්ව ඇත. භාෂාව. නර්තනය. සංගීතය මෙන් ම දේහ ලක්ෂණවලින් පවා තරමක වෙනස් ජන කණ්ඩායමක් වුව ද ශ්‍රී ලංකාව තුළ ඔවුන් ද සම අයිතිවාසිකම් ඇති පිරිසක් බව තේරුම්ගත යුතු තත්ත්වයකි. විශේෂයෙන් අතීතයේ ඔවුන් වහල් සේවය සඳහා යොදවා ඇති බැවිනි (Kopinath and Herath, 2005; Lindfors, 1996). එබැවින් රාජ්‍ය මෙන් ම පෞද්ගලික මට්ටමින් ද විවිධ

වැඩසටහන් හරහා මිනිස් ආකල්ප සංවර්ධනය සඳහා යොමුවීම මෙහි දී වැදගත්කොට පෙන්වාදිය හැකි ය. විශේෂයෙන් අනාගත පර්යේෂණ නාභීන් (future research foci) ඒ කෙරෙහි යොමුවීම ඉතා වටී.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි

### ග්‍රන්ථ :


අභයසිංහ, ටී. (1969). **පෘතුගීසීන් හා ලංකාව**. කොළඹ: සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්මන්ට්ස් සමාගම.

අල්විස්, පී. (2004). **නොක්ස් දුටු ලක්දිව**. කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

ආරියරත්න, එස්. (1985). **බයිලා කපිරිඤ්ඤා විමර්ශනයක්**. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඇල්ලේපොළ, එච්. ඇම්. එස්. (2008). **ඩේවි දුටු ලංකාව**. බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

ඉන්ද්‍රජිත්, එච්. ඒ. එන්. (2007). **ලෝකයේ ප්‍රාථමික ජනතාව**. නුගේගොඩ: වින්දන ප්‍රකාශන.

එදිරිසිංහ, පී. (2000). **බ්‍රෝහියර්ගේ කොළොම්පුර පුරාවෘත්තය**. බොරලැස්ගමුව: විසිදුන ප්‍රකාශකයෝ.

කුමාර, එන්. වී. ජී. ඒ. එච්. (2016). **සමාජ විද්‍යාව; මූලික සංකල්ප, න්‍යාය සහ ක්‍රමවේදය**. පුංචි බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

ගන්කන්ද, එන්. (2007). **අපි නොදන්න ලාංකිකයෝ**. ගල්කිස්ස: සුරත ප්‍රකාශකයෝ.

ගුණතිලක, ආර්. එන්. (2016). **පර්යේෂණ විධික්‍රම**. මහරගම: තරංජි ප්‍රින්ටර්ස්.

නෙස්තුර්ඞ්, එම්. (1981). **මිනිසාගේ සම්භවය**. මොස්කව්: ප්‍රගති ප්‍රකාශන මන්දිරය.

දිසානායක, එස්. (2004). **මානව වර්ගීකරණය**. බත්තරමුල්ල: සමීර ප්‍රකාශකයෝ.

දිසානායක, ජේ. බී. (2014). **මානව භාෂා ප්‍රවේශය**. මහරගම: තරංජි ප්‍රින්ටර්ස්.

පියසේන, ඒ. (1966). **මානව භූගෝල විද්‍යාව**. මහනුවර: සීමාසහිත කැන්ඩි ප්‍රින්ටර්ස්.

පොන්නම්පෙරුම, ඩී. පී. (1967). **විදේශියන් දුටු පුරාණ ලංකාව**. කොළඹ: සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සමාගම.

රස්නායක, ආර්. එම්. ඩබ්. එස්. (2007). **ශ්‍රී ලංකාවේ වෙසෙන කාපිරි ජනතාව**. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෝමසුන්දර, ඩී. (2007). **හෙළදිව්වාසීන් සහ ආදිවාසීන්**. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හෙට්ටිආරච්චි ඩී. ඊ. (1963). **සිංහල විශ්වකෝෂය (පළමු කාණ්ඩය)**. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, (2019) සම්පත් පැතිකඩ

සිරම්බිඅඩිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය, (2018 - 2019) සම්පත් පැතිකඩ

අත්තනායක, ඕ. (2016). එදා යදමින් බැඳ ගෙනවිත් යුද්ධත් කරපු කැරලිත් ගහපු මෙදා පුත්තලමේ පැත්තකට වී සිටින ලංකාවේ කාපිරි. **දිවයින**, [online] Available at: https://www.divaina.com/2016/11/27/feature22.html [Accessed 23 Feb. 2021].

කුරුලුවංශ, ඒ. සහ පූර්ණිමාල්, පී. (2017) මොසැම්බික් සිට ඇවිත් අපේ වී. **දිණමින පුවත්පත**, කොළඹ: ලේක්හවුස් පුවත්පත් ප්‍රකාශන, පි.38.

ජයමාන්න, පී. පී. (2017). 'ලාංකීය සමාජය විචිත්‍රවත් කළ කැෆ්රිවරු'. **සත්හඬ**, www.sathhada.com [Accessed 8 Nov. 2020], පි.5.

දිසානායක, ඒ. (1996). මැන්ඩෙලාගේ හා ඔඩුම්බෙලාගේ සිංහල නෑදෑයෝ. **දිවයින**, කොළඹ: උපාලි පුවත්පත් සමාගම, පි.3.

පෙරේරා, ආර්. (2017). ටික ටික නැතිවෙන ලංකාවේ කාපිරි ජනයා. දේශය, [online] Available at: http://www.deshaya.lk/article/51 [Accessed 23 Feb. 2021].

සමරවික්‍රම, අයි. (2018). කාලේ වෙනසට තාලේ අලුත්වුණු සිරම්බිඅඩියේ මිනිස්සු. සිළුමිණ, [online] Available at: http://www.silumina.lk/2018/05/26/ [Accessed 23 Feb. 2021].

Akmeemana, K.M.N.U. and Kamalrathne, T. (2020). Patterns and Challenges of Social Identity: An Analysis of Third Space Perspective on Afro-Sri Lankans in Sirambiadiya. [online] Available at: http://ir.kdu.ac.lk/handle/345/3034 [Accessed 2 Mar. 2021].

Arachchige, S. A. (2017). Kaffirs of Sri Lanka. [Online] Available at: https://www.researchgate.net/publication/317317221_Kaffirs_of_Sri_Lanka [Accessed 8 Nov. 2020].

Barnes-Mauthe, M., Arita, S., Allen, S.D., Gray, S.A. and Leung, P. (2013). The influence of ethnic diversity on social network structure in a common-pool resource system: implications for collaborative management. *Ecology and Society*, [online] 18(1). Available at: [Accessed 8 Nov. 2020].

Bellotti, E., (2008). What are friends for? Elective communities of single people, *Social Networks,* 30, pp. 318–329.

Brown, R. (1999). *Illustrated Encylopadia of People and Culture of the World.* 2nd ed. New Delhi: Aryan Books International.

Dissanayaake, P. and Premarathne, P. (2016). Are we different from you: Changing facets of Kaffir community in SriLanka. [Online] Available at: https://www.researchgate.net/publication/294426994_Are_we_different_from_you_changing_facets_of_Kaffir_community_in_Sri_Lanka [Accessed 8 Nov. 2020].

Hanneman, R.A. and Riddle, M. (2005). *Introduction to Social Network Methods.* California: University of California Press. [online] Available at: http://faculty.ucr.edu/~hanneman/nettext/ [Accessed 8 Oct. 2020].

Harari, Yuval N. ( 2015). *Sapiens : a brief history of humankind*. New York : Harper.

Hornby, A. S. (2015). *Oxford Dictionary*. 9th ed. Oxford: Oxford University Press.

Jayasuriya, S.D.S. (2005). The Portuguese Identity of the Afro-Sri Lankans.

*Lusotopie*, [online] 12(1-2), pp.21-32. Available at: https://journals.openedition.org/lusotopie/1164 [Accessed 10 Oct. 2020].

Jayasuriya, S.D.S. (2006). Trading on a thalassic network: African migrations across the Indian Ocean. *International social science journal*, [online] 58(188), pp.215-225. Available at: https://onlinelibrary.wiley.com/doi/abs/10.1111/j.1468-2451.2006.00613.x [Accessed 8 Oct. 2020].

Jayasuriya, S.D.S. (2007). A Forgotten Minority: The Afro-Sri Lankans. *African and Asian Studies*, [online] 6(3), pp.227-242.Available at: https://brill.com/view/journals/aas/6/3/article-p227_3.xml [Accessed 8 Oct. 2020].

Jayasuriya, S.D.S. (2019). A Hybrid Performance: East African Spirit Possession and Sri Lankan Manhas. *Journal of Africana Religions*, [online] 7(1), pp.105-111. Available at: https://www.jstor.org/stable/10.5325/jafrireli.7.1.0105?seq=1 [Accessed 8 Oct. 2020].

Jayawardene, S. (2013). Pushing the Paradigm: Locating scholarship on the Siddis and Kaffirs. *Journal of Black Studies*, [online] 44(7), pp.687-705. Available at: https://journals.sagepub.com/doi/10.1177/0021934713508781 [Accessed 29 Oct. 2020].

Karunarathne, Y.A. and Lee, Gunhak (2019), Traditional social capital and socioeconomic networks in response to flood disaster: A case study of rural areas in Sri Lank, *International Journal of Disaster Risk Reduction,* 41, pp. 101-279.

Karunarathne, A.Y. and Lee, G. (2020). The geographies of the dynamic evolution of social networks for the flood disaster response and recovery. *Applied geography*, 125, pp.102-274.

Knoke, D. & Yang, S. (2008). *Social Network Analysis.* Los Angeles: CA: Sage.

Kopinath, C. and Herath, H.M.D.R. (2005). The Present of Past Slaves: The Socio Economic Situation of Sri Lankan Kaffir People. *Peradeniya economic Research symposium: University of Peradeniya.* [online] Available at: http://arts.pdn.ac.lk/econ/piers2019/Proceedings2015/The%20Present%20of%20Past%20Slaves%20%20The%20Socio%20Economic%20Situation%20of%20Sri%20Lankan%20Kaffir%20People.pdf [Accessed 12 Dec. 2020].

Lindfors, B., (1996). Hottentot, Bushman, Kaffir: Taxonomic tendencies in

nineteenth-century racial iconography. *Nordic Journal of African Studies*, [online] 5(2), pp.1-28. Available at: https://www.njas.fi/njas/article/view/664 [Accessed 11 Oct. 2020].

Mac Ginty, R., (2010). Social network analysis and counterinsurgency: a counterproductive strategy?. *Critical Studies on Terrorism*, [online] 3(2), pp.209-226. Available at: [Accessed 10 Oct. 2020].

Serrat, O. (2017). *Social network analysis: In Knowledge solutions*. Singapore. Springer.

Stadtfelda, C., Takács, K., and Vörös, E., (2020). The Emergence and Stability of Groups in Social Networks, *Social Networks*, 60, pp. 129–145.

Walker, O. (1949). Kaffirs are Lively. *London: Victor Gollancz*, [online] Available at: http://vidyaonline.org/dl/kafir.pdf [Accessed 10 Oct. 2020].

Wittek, Kroneberg, and Lämmermann, (2020). Who is fighting with whom? How ethnic origin shapes friendship, dislike, and physical violence relations in German secondary schools, *Social Networks*, 60, pp. 34–47.

**වෙබ් අඩවි**

ගුණවර්ධන, ආර්. (2019). සිලෝන් කැෆර්වරු. [online] Lanka Newsweek. Available at: https://lankanewsweek.com/53-lanka_news_week [Accessed 13 Dec. 2020].

නිමන්ත, පී. (2020). කවුද මේ ''සිලෝන් කැෆර්ස්?''. [online] perabeats. Available at: https://perabeats.lk/2020/05/06/ [Accessed 13 Dec. 2020].

විජයවර්ධන, කේ. (2021). අප්‍රිකාවෙන් ඇවිත් සිරම්බිඅඩියේ පවුල්කන සිංහල කාපිරි. [online] Roar Media. Available at: https://roar.media/sinhala/main/features/sri-lankan-sinhala-kaffirs [Accessed 2 Mar. 2021].

*African Sri Lankans: A History Of The Resilience And Rejuvenation Of People Called 'Kapiri' Or 'Kaffirs'*. [online] weebly. Available at: http://africansrilankans.weebly.com [Accessed 8 Nov. 2020].

*Kaffirs of Sri Lanka*. [online] Kiptra. Available at: https://kiptra.com/lifestyle/kaffirs-of-sri-lanka/ [Accessed 13 Dec. 2020].

## උපග්‍රන්ථ 03: මුස්ලිම් - කැෆර් සම්බන්ධතා න්‍යාසය

| | | 1 Q1 | 2 Q2 | 3 Q3 | 4 Q4 | 5 Q5 | 6 Q6 | 7 Q7 | 8 Q8 | 9 Q9 | 10 Q10 | 11 Q11 | 12 Q12 | 13 Q13 | 14 Q14 | 15 Q15 | 16 Q16 | 17 Q17 | 18 Q18 | 19 Q19 | 20 Q20 | 21 Q21 | 22 Q22 | 23 Q23 | 24 M1 | 25 M2 | 26 M3 | 27 M4 | 28 M5 | 29 M6 | 30 M7 | 31 M8 | 32 M9 | 33 M10 | 34 M11 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Q1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2 | Q2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 3 | Q3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 4 | Q4 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 5 | Q5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 6 | Q6 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 7 | Q7 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 8 | Q8 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 9 | Q9 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 10 | Q10 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11 | Q11 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 12 | Q12 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 13 | Q13 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 14 | Q14 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 15 | Q15 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 16 | Q16 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 17 | Q17 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 18 | Q18 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 |
| 19 | Q19 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 20 | Q20 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 |
| 21 | Q21 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 22 | Q22 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 23 | Q23 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 24 | M1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 25 | M2 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 26 | M3 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 27 | M4 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 28 | M5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 29 | M6 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 30 | M7 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 31 | M8 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 32 | M9 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 33 | M10 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 34 | M11 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |

34 rows, 34 columns, 1 levels.

## උපග්‍රන්ථ 04: සේවා නිලධාරී - කැෆර් සම්බන්ධතා න්‍යාසය

| | | 1 Q1 | 2 Q2 | 3 Q3 | 4 Q4 | 5 Q5 | 6 Q6 | 7 Q7 | 8 Q8 | 9 Q9 | 10 Q10 | 11 Q11 | 12 Q12 | 13 Q13 | 14 Q14 | 15 Q15 | 16 Q16 | 17 Q17 | 18 Q18 | 19 Q19 | 20 Q20 | 21 Q21 | 22 Q22 | 23 Q23 | 24 GN | 25 AG | 26 DO | 27 CO | 28 M | 29 F | 30 BM | 31 MD | 32 P(S) | 33 P(K) | 34 P(A) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Q1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 2 | Q2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 |
| 3 | Q3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 4 | Q4 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 |
| 5 | Q5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 |
| 6 | Q6 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 |
| 7 | Q7 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 8 | Q8 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 9 | Q9 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 10 | Q10 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 |
| 11 | Q11 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 |
| 12 | Q12 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 |
| 13 | Q13 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 |
| 14 | Q14 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 |
| 15 | Q15 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 0 |
| 16 | Q16 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 |
| 17 | Q17 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 |
| 18 | Q18 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 |
| 19 | Q19 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 |
| 20 | Q20 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 |
| 21 | Q21 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 0 |
| 22 | Q22 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 |
| 23 | Q23 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 0 |
| 24 | GN | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 25 | AG | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 26 | DO | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 27 | CO | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 28 | M | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 29 | F | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 30 | BM | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 31 | MD | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 32 | P(S) | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 33 | P(K) | 1 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 34 | P(A) | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |

34 rows, 34 columns, 1 levels.